# කථාවත්ථුප්පකරණයේ පුද්ගල කථා පරිච්ඡේදයේ සංගෘහිත වාද ක්‍රමය පිළිබඳ අධ්‍යයනයක්

**දිල්ශාන් මනෝජ් රාජපක්ෂ**
පර්යේෂණ සහකාර, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය
dilshanmanojrajapaksha@gmail.com

**සංක්ෂේපය**

ක්‍රි.පූ. තෙවන සියවස තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස අභිධර්ම පිටකයේ සප්තප්පකරණය සම්පූර්ණ කරමින් මොග්ගලීපුත්ත තිස්ස හිමි විසින් රචනා කරන ලද'යි ශාසන ඉතිහාසය පෙන්වා දෙන කථාවත්ථුප්පකරණයට ලැබෙන්නේ සුවිශේෂ ස්ථානයකි. අනුක්‍රමයෙන් සංවර්ධනය වෙමින් පැවති අභිධර්ම පිටකයට අවසාන වශයෙන් එක් වූ ග්‍රන්ථය කථාවත්ථුප්පකරණය යි. අත්ථසාලිනියේ දී ම බුදුගොස් හිමි කථාවත්ථුව බුදුන්වහන්සේ වෙත ම පැවරීමට නො පැහැදිලි ලෙස උත්සාහ කරති. අනාගතය දකින්නා වූ තථාගතයන් වහන්සේ විසින් ම අනුක්‍රමයෙන් සංඝයා අතර පැන නැගෙන්නා වූ සහ ඔවුන්ගේ සමගිය බිඳ හෙළන්නා වූ අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධ මත පිළිබඳ පූර්වාපේක්ෂාවෙන් යුතු ව එම ග්‍රන්ථයේ සාකච්ඡා කොට තිබෙන ධර්ම මාතෘකා හා සැකැස්ම ද ප්‍රකාශ කරන ලද්දේ ය, යන මතය අත්ථසාලිනිය දරයි. නමුත් කථාවත්ථුවේ සඳහන් පරවාදී මත බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් ගණනකට පසු උපත ලද බව පැහැදිලි කරුණකි. සිංහල විශ්වකෝෂයේ කථාවත්ථුව පිළිබඳ දැක්වෙන අදහසට අනුව වාද (විවාද) පර්යාය වූ කථා යන පදය මෙම ග්‍රන්ථය සම්බන්ධයෙන් භාවිත වී ඇත්තේ පාරිභාෂික අර්ථයෙනි.[1] ''වත්ථු'' යන පදය සමඟ යෙදුණු විට කථාවත්ථු යන්නෙන් **''වාදයට තුඩුදුන් මාතෘකා''** යන අර්ථය ලැබේ. මෙබඳු කථාවත්ථු සංග්‍රහ කළ ප්‍රකරණය කථාවත්ථුප්පකරණ නම් වේ.[2]

කථාවත්ථුප්පකරණයේ සමස්තය ම දෙස බලන විට එය වරින්වර ඇතුළත් කරන ලද කොටස්වලින් සමන්විත බව පෙන්වා දෙන ඥාණතිලෝක හිමි කථාවත්ථුප්පකරණය ඒක කර්තෘක කෘතියක් ලෙස පිළිගැනීම අපහසු බව දක්වයි.[3] ඇතැම් පඬිවරුන්ගේ මතය වන්නේ මෙම ග්‍රන්ථය අශෝක කාලීන සිද්ධාන්ත පමණක් බණ්ඩනය කළා පමණක් නොව, පසුකාලීන සම්ප්‍රදාය හා සිද්ධාන්ත ද බණ්ඩනය කර එයට එකතු කර ඇති බව යි.[4] ඔවුන්ගේ මතයට අනුව ඇතැම් කොටස් ක්‍රි.ව. 1 දක්වා එකතු වී ඇත.[5] මේ අනුව පාලි සාහිත්‍යයේ ඉතිහාසය නම් ග්‍රන්ථයට අනුව අශෝක සමයේ දී රචිත කථාවත්ථුව විවාදයට ගෙන ඇත්තේ එවකට පැවති වාද අටක් පමණි. ඒ හැර මෙහි විවාදයට ගැනෙන සෙසු වාද පශ්චාත් කාලීන සම්ප්‍රදාවලට අයත් වෙයි. අත්ථසාලිනී හා පඤ්චප්පකරණට්ඨකථා සඳහන් කරන ආකාරයට බුදුරජාණන්වහන්සේ දේශනා කළ කථාවත්ථුව මුල දී ප්‍රමාණයෙන් බණවරකටත් වඩා අඩු ය. එහෙත් පසු ව මොග්ගලීපුත්තතිස්ස හිමි සකවාද පන්සියයක් හා පරවාද පන්සියයක් එකතු කර වාද දහසකින් සමන්විත විශාල ග්‍රන්ථයක් ලෙස සකසා ඇත.[6] ඒ අනුව, බණවර හැට හතරකින් (64) යුත් කථාවත්ථුවේ වග්ග හෙවත් පරිච්ඡේද 23ක් අන්තර්ගත වේ. එහෙත් මෙහි අන්තර්ගත වාද කථා ප්‍රමාණය පිළිබඳ උගතුන් අතර

ඒකමතික බවක් නො පෙනේ. කථාවත්ථු පෙරවදනට අනුව මෙහි වාදකථා 217ක් වුව ද[7] ඇතැම් මූලාශ්‍රය හා උගතුන් මෙහි අන්තර්ගත වන වාද 216ක් ලෙස ද,[8] 218ක් ලෙස ද,[9] 219ක් ලෙස ද[10] දක්වා තිබේ. කෙසේ වෙතත් කථාවත්ථු පෙරවදනට අනුව විවිධ නිකායිකයන් සමඟ පැවැත්වූ විවාද පහත පරිදි ය.[11]

| නිකාය | වාද සංඛ්‍යාව |
|---|---|
| 1. අන්ධක වාද | 71 |
| 2. උත්තරාපථක | 41 |
| 3. මහාසාංඝික | 32 |
| 4. පුබ්බසෙලිය | 27 |
| 5. සම්මිතීය | 25 |
| 6. රාජගිරික | 10 |
| 7. සිද්ධත්ථික | 10 |
| 8. හේතුවාදි | 10 |
| 9. මහිංසාසක වාද | 09 |
| 10. අපරසෙලීය | 05 |
| 11. වෙතුල්ලක | 03 |
| 12. සබ්බත්ථිවාද | 02 |
| 13. වජ්ජිපුත්තක | 02 |
| 14. කස්සපිය | 01 |
| 15. ගෝකුලික | 01 |
| 16. භද්‍රයානික | 01 |

කථාවත්ථුප්පකරණය කරුණු දෙකක් නිසා වැදගත් වන බව සිංහල විශ්වකෝෂය පෙන්වා දෙයි. එනම්,

1. ධර්ම විනය මුල් කොටගෙන නිකාය වශයෙන් බෙදී ව්‍යාප්ත වූ බුදු සසුනේ ඉතිහාසය හැදෑරීමට ඉන් ලැබෙන පිටිවහල
2. පාලි සොපතොයෙන් පිළිබිඹු වන ථේරවාද බුද්ධ ධර්මයට තාර්කික අංශය ගැන සොයා ගැනීමේ මූලාශ්‍රයක් වීම[12] යනාදිය යි.

මෙය තවත් ආකාරයකින් දක්වන්නේ නම් කථාවත්ථුවේ සමස්ත විවාදය තුළින් හැදූරිය හැකි කරුණු හතරක් යටතේ සාරාංශ කළ හැකි ය. එනම්,

1. ශාසන ඉතිහාසය හැදෑරීම.
2. බෞද්ධ දර්ශනය ක්‍රමිකව වෙනස්කම්වලට භාජනය වී සංවර්ධනය වූ අයුරු හැදෑරීම.
3. බෞද්ධ සම්ප්‍රදායිකයින් අතර ඇති වන ධර්ම පිළිබඳ විවාද හැදෑරීම.

4. ථෙරවාද සම්ප්‍රදාය හා අනෙක් නිකාය විවාද සඳහා භාවිත කළ තාර්කික ක්‍රමවේදය හැදෑරීම, යනාදිය යි.

පාලි සාහිත්‍යයෙන් පිළිබිඹු වන බුදු දහමෙහි තාර්කික ස්වරූපය විමසීමේ දී කථාවත්ථුව විහිදුවන ආලෝකය අතිමහත් ය. වෙන ම ග්‍රන්ථයක් වශයෙන් ගත් විට ද එහි අඩංගු තාර්කික ලක්ෂණ තුළින් සමකාලීන භාරතීය සමාජයේ භාවිත වූ තර්ක-වාද ශාස්ත්‍රයට අයත් ක්‍රමවේදයක් ද සොයා ගත හැකි ය. බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන පාර්ශ්වයෙහි ලා අවධානය යොමු කෙරෙන මෙම පර්යේෂණයේ දී මූලික ව යොමු වන්නේ කථාවත්ථුප්පකරණයට වන අතර එහි ද පුද්ගල කථා පරිච්ඡේදයේ සංගෘහිත වාද ක්‍රමය කෙරේ සීමා වෙමින් අධ්‍යයනය සිදු කෙරේ.

### කථාවත්ථුප්පකරණයෙහි තාර්කික හා වාද ක්‍රමවේදය

කථාවත්ථුවේ නිරූපණය වන්නේ මිලින්දපඤ්හයේ දී මෙන් බෞද්ධ හා අබෞද්ධ යන දෙපක්ෂයක් අතර සිදුවුණු වාදයක් නොවේ. යම් යම් ධර්ම කරුණු සම්බන්ධයෙන් බෞද්ධයන් අතර ම ඇති වූ මතභේද විවාදයට ගැනීමක ප්‍රතිඵලයක් ලෙස කථාවත්ථුව හඳුන්වා දිය හැකි ය. වාදයට එළඹ සිටින්නන් සියලු දෙනා බෞද්ධයන් නිසා බුද්ධ වචනය (සුත්තන්ත) ප්‍රාමාණික ව පිළිගනියි. එහෙයින් කවර පක්ෂයක් විවාදයට තුඩුදුන් ප්‍රශ්නයට අදාළ බුද්ධ වචනයේ නියම ලෙස අවබෝධ කර ගෙන සිටින්නේ ද, යන්න ඒත්තු ගැන්වීම මත ජය පරාජය අප්‍රකාශිත ව ව්‍යංගයෙන් සිදු කෙරේ. කෙසේනමුත් සකවාදී - පරවාදී නමින් යෝජක ප්‍රතියෝජක දෙපිරිස සිය මතය තහවුරු කිරීමට ගන්නා උත්සාහය තුළින් කථාවත්ථුප්පකරණයේ සංවර්ධනීය විවාදයක ලක්ෂණ ද තාර්කික සංව්‍යාක්‍යාමය ලක්ෂණ ද ප්‍රකට වේ. කථාවත්ථුප්පකරණයේ එන සමස්ත වාද ක්‍රමය ප්‍රධාන අවයව තුනකින් යුක්ත ය. එනම්,

1. ඨපනා - විරුද්ධ මතය බිඳීම සඳහා ඉදිරිපත් කරන වාද කථාවේ පූර්ව පක්ෂය
2. පාපනා - ඨපනාවෙන් පැනෙන ඵලය
3. ආරෝපනා - ප්‍රතිවාදියා මත නැගෙන නිග්‍රහය හෙවත් පරාජය[13] යනාදිය යි.

ඉහත කී අවයව කථාවත්ථුප්පකරණයේ ප්‍රධන ක්‍රමවේද දෙකක් යටතේ ගෙනහැර දක්වා තිබේ. එනම්,

1. අනුලෝම - මුල සිට අගට අස්ථ්‍යාර්ථවාචී ව ප්‍රශ්න ඇසීම.
2. පටිලෝම - අග සිට මුලට නස්ථ්‍යාර්ථවාචී ව ප්‍රශ්න ඇසීම, යනාදිය යි.

කථාවත්ථුවේ අනුලෝම ක්‍රමවේදය අනුගමනය කරමින් වාදය සිදුවන අයුරු පහත ආකාරයෙන් දැක්විය හැකි ය.

සකවාදී : ''අ'' කාර දෙකක් එක්වූ සන්ධි වීමෙන් ''ආ'' කාරයෙක් වේද? (පුච්ඡා)

පරවාදී : එසේ යැ (පටිජනනා-පටිඤ්ඤා)

සකවාදි : ''ඉ'' කාර දෙකක් එක්වූ සන්ධි වීමෙන් ''ඊ'' කාරයෙක් වේද? (අනුයෝග)

පරවාදී : එසේ නොකියැ යුතු යැ, නැත යනු යි. (පටික්ඛේප)

සකවාදී : ''අ'' කාර දෙකක් එක්වැ සන්ධි වීමෙන් ''ආ'' කාරයෙක් වේ නම්,

(අනුලෝම ඨපනා)

සකවාදී : ''ඉ'' කාර දෙකක් එක්වැ සන්ධිවීමෙන් ''ඊ'' කාරයෙක් වේ යැයි කියැ යුතු ය.

(අනුලෝම පාපනා)

සකවාදී ''අ'' කාර දෙකක් එක්වැ ''ආ'' කාරයක් වන බව පිළිගන්නා තෙපි ''ඉ'' කාර ද්වයක් එක්වැ ''ඊ'' කාර වන නො පිළිගන්නාව. එහෙයින් ''ඉ'' කාර ද්වයක් එක්ව ''ඊ'' කාර නොවේ යැයි තොප කියන බස සාවද්‍ය ය. තොපගේ බස වරද බව ඔප්පු වී යැයි සේ ය. (අනුලෝම-ආරෝපනා)[14]

කථාවත්ථුවේ මෙම තර්ක ක්‍රමය අවරදිග නූතන තර්ක ක්‍රමයට ද සමාන ය. උදාහරණ ලෙස

- අ + අ දෙක ආ වේ නම්,
- ''ඉ'', ''ඉ'' දෙක ''ඊ'' වෙයි. (එහෙත් තොප මතයෙහි ඉ, ඉ දෙක ඊ නොවෙයි.)
- එසේ නම් ''අ'' + ''අ'' දෙක ද ආ නොවේ.[15]

කථාවත්ථුවේ පටිලෝම ක්‍රමවේදය අනුගමනය කරමින් වාද සිදුවන අයුරු සඳහා නිදසුනක් මෙසේ දැක්විය හැකි ය.

සකවාදී : ''ඉ'' + ''ඉ'' දෙක එක්වැ ''ඊ'' කාර නොවේ නම් (පටිලෝම-ඨපනා)

සකවාදී : ''අ''+ ''අ'' දෙක එක්වැ ''ආ'' කාරයෙක් වේ යැයි ද නො කියැ යුතු ය.

(පටිලෝම පාපනා)

සකවාදී : ''ඉ''+ ''ඉ'' දෙක එක්වැ ''ඊ'' කාර නොවේ යැයි තොප කියන බස මිථ්‍යා වේ.

(පටිලෝම-ආරෝපනා)[16]

අවරදිග තර්ක ක්‍රමය අනුව ඉහත කී තර්කය දැක්විය හැක්කේ මෙසේ ය.

- ''ඉ''+ ''ඉ'' දෙක ''ඊ'' නොවේ නම්,
- ''අ''+ ''අ'' දෙක ''ආ'' නොවේ.
- එහෙත් ''අ''+ ''අ'' දෙක ''ආ'' වේ.
- එහෙයින් ''ඉ''+ ''ඉ'' දෙක ''ඊ'' ද වේ.[17]

කෙසේවෙතත් අනුලෝම හා පටිලෝම පක්ෂ දෙකෙන් ම පාපනාව අවරදිග තර්ක ක්‍රමය තුළ ක්‍රමයෙන් ඉවත් වී තිබේ. අනුලෝම හ පටිලෝම තර්ක ක්‍රමවේද බටහිර තර්ක ශාස්ත්‍රයේ ද භාවිත වේ. එනම්,

1. අනුලෝම ⟶ අස්තිප්‍රකාරය (Mudus ponens)

$P \longrightarrow Q$

2. පටිලෝම ⟶ නාස්තිප්‍රකාරය ^Mudus Tollens&

Q→ P යනුවෙනි.

| අස්තිප්‍රකාර තර්ක ක්‍රමය | නාස්තිප්‍රකාර තර්ක ක්‍රමය |
|---|---|
| If P Then Q | If not Q then Not P |
| = P>Q | = P>Q |
| = P | = NO + Q |
| = ∴ Q | = ∴ NO + P |

ඉහත කී පරිදි ඨපනා, පාපනා, ආරෝපනා යනාදිය තුළින් කථාවත්ථුපකරණයේ විකාශය වන අතිශය වැදගත් තාර්කික ක්‍රමවේදයක් දැකිය හැකිවේ. මේ බව මනාව පැහැදිලි වන්නේ මෙහි සුද්ධ සච්චිකට්ඨ ආදිය විග්‍රහ කිරීමට භාවිත වී ඇති අනුලෝම පච්චනික හා පච්චනික අනුලෝම පඤ්චකයන් තුළිනි. ඨපනා, පාපනා, ආරෝපනා සමඟ යෙදෙන අනුලෝම පඤ්චකයේ පංච අවයවයන් මෙසේ ය.

1. පුච්ඡා - ප්‍රශ්න ඇසීම.
2. පටිඤ්ඤා - එය පිළිගැනීම.
3. අනුයෝග - එහි වරද පෙන්වා දීම.
4. පටික්ඛේප - ප්‍රතික්ෂේප කිරීම.
5. නිග්ගහ - නිග්‍රහ කිරීම යනාදිය යි.

පශ්චත් කාලීන න්‍යායායිකයන්ගේ පංච අවයව සංවාක්‍යයක් පහත පරිදි වේ.

1. ප්‍රතිඥා
2. හේතු (අපදේශ)
3. උදාහරණ
4. උපනය (අනුසම්බන්ධ)
5. නිගමන[18]

මෙම පඤ්ච අවයව සංවාක්‍යයේ ලක්ෂණ ඉහත කී අනුලෝම පඤ්චකයේ ඇතැම් සංවාක්‍ය සමඟ මනා ව තුලනය වේ. නිදසුන් ලෙස න්‍යායිකයන්ගේ ''ප්‍රතිඥා'' යන්න කථාවත්ථුප්පකරණයේ අනුලෝම පඤ්චකය තුළ ''පටිඤ්ඤා'' ලෙස දැක්වේ. අනුලෝම පඤ්චකයේ පුච්ඡා සමඟ යෙදෙන ''පටිඤ්ඤා'' යන්න පශ්චාත් කාලීන න්‍යායිකයන් ඉවත් කර ඇත්තේ පටිඤ්ඤාවෙන් කියැවෙන දේ මුලින් පුච්ඡා යන්නෙන් කියැවෙන නිසා ය. එසේ ම මෙම අනුලෝම පඤ්චකයේ ''අනුයෝග'', ''පටික්ඛේප'', ''නිග්ගහ'' යනාදිය වාචික විවාදයක ලක්ෂණ මැනවින් ප්‍රකට කරයි.

**කථාවත්ථුප්පකරණයෙහි තාර්කික හා වාද ක්‍රමවේදය පුද්ගල කථා පරිච්ඡේදය ඇසුරෙන්**

සමස්ත කථාවත්ථුප්පකරණයේ විස්තෘත හා සංකීර්ණ ලෙස දක්වෙන තාර්කික ක්‍රමවේදය සංක්ෂිප්ත ව හඳුනාගත හැකි ය. මෙහි දී ''පුද්ගල කථා'' පරිච්ඡේදය අතිශයින් වැදගත් වෙයි. ඊට හේතුව නම්, කථාවත්ථුප්පකරණයේ අනෙකුත් පරිච්ඡේදවල පෙය්‍යාල ක්‍රමයට දක්වා ඇති විවාදය සම්පූර්ණ විස්තර සහිත ව දක්වෙන්නේ පුද්ගලකථා පරිච්ඡේදයේ අන්තර්ගත වන නිසා ය. කථාවත්ථුප්පකරණයේ සමස්ත තාර්කික ක්‍රමවේදය අධ්‍යයනය කරන විට තාර්කික පුද්ගල කථා පරිච්ඡේදයේ වැදගත්කම පහත පරිදි සාරාංශ කළ හැකි ය. එනම්,

- සච්චිකට්ඨ ප්‍රශ්න කථාව සුද්ධ සච්චිකට්ඨ ඕකාස සච්චිකට්ඨ, කාල සච්චිකට්ඨ අවයව සච්චිකට්ඨ යනාදිය විග්‍රහ වන අයුරු දක්වීම.
- ඉහත කී සච්චකට්ඨ අනුලෝම පච්චනික හා පච්චනික අනුලෝම පඤ්චක යටතේ විග්‍රහ කරන අයුරු දක්වීම.
- ඉහත කී කරුණු විස්තර කිරීමට භාවිත කරන ප්‍රධාන මාතෘකා අටළොසකට (18) ද අමතර ව පඤ්ච අවයව, ද්වාදසායතන, අට්ඨාරසධාතු බාවිසිතීන්ද්‍රිය යනාදී ලෙස සෑම කරුණක් ම පනස්හත් (57) වැදෑරුම්ව විවාදයට ගැනීම, යනාදී හේතු සාධක නිසා ය.

මෙම පරිච්ඡේදයේ එසේත් නැතිනම් පුද්ගල කථාවේ අන්තර්ගත වාද වර්ගීකරණය හැදෑරීමේ දී සච්චිකට්ඨ ප්‍රශ්න කථාව අතිශය වැදගත් වන අතර එහි අන්තර්ගතය සතර වැදෑරුම් ව බෙදෙයි. එනම්,

1. සුද්ධසච්චිකට්ඨය (කේවළ)
2. ඕකාසසච්චිකට්ඨය (සබ්බත්ථ)
3. කාලසච්චිකට්ඨ (සබ්බදා)
4. අවයවසච්චිකට්ඨ (සබ්බේසු) යනුවෙනි.

මෙහි සුද්ධසච්චිකට්ඨය නම් සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් පුද්ගලයෙක් සිටී ද? යන ප්‍රශ්නය අන් කරුණක් හා මිශ්‍ර නො කොට විග්‍රහ කිරීම යි. කථාවත්ථුප්පකරණයෙහි පුද්ගල කථාවේ සම්පූර්ණයෙන් විග්‍රහ කොට ඇත්තේ මෙම මාතෘකාව පමණි. මේ අනුව, සුද්ධ සච්ඡිකට්ඨය විග්‍රහ වන්නේ තවත් කරුණු දාහතක් (17) යටතේ ය. එනම්,

1. සුද්ධික සංසන්දනා
2. ඔපම්ම සංසන්දනා
3. චතුක්කනය සංසන්දනා
4. ලක්ඛණ යුක්ති කථා
5. වචනසෝධන
6. පඤ්ඤත්තානුයෝග

7. ගති - චුති - පටිසන්ධි - අනුයෝග
8. උප්පපාදාන පඤ්ඤත්තානුයෝග
9. පුරිසකාරානුයෝග
10. අභිඤ්ඤානුයෝග
11. ඤාතක අනුයෝග
12. ජාති අනුයෝග
13. පටිපත්ති අනුයෝග
14. උප්පත්ති අනුයෝග
15. පටිවේධානුයෝග
16. සංඝානුයෝග
17. සච්චිකට්ඨසභාවානුයෝග යනාදිය යි.

1. පුද්ගල ප්‍රශ්නය විග්‍රහ කිරීම සඳහා කථාවත්ථුවෙහි උපයෝගී කොට ගෙන ඇති පඤ්ච ඉන්ද්‍රිය, ද්වාදස ආයතන, අට්ඨාරස ධාතු සහ බාවිසතින්ද්‍රිය යන කරුණු පනස්හතක් (57) සුද්ධ සච්චිකට්ඨයෙන් විග්‍රහ කළ ''පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨ පරමට්ඨෙන'' යන ප්‍රශ්නය හා සම්බන්ධ කොට විග්‍රහ කිරීම ''සුද්ධික සංසන්දනා'' නම් වේ. ''සුද්ධ'' යන පදයට ''ඉක'' ප්‍රත්‍යය යොදා ''සුද්ධික'' යනුවෙන් සකසා ''සුද්ධ සච්ඡිකට්ඨ'' යන්න සමුඟ ඍජු ව ම සම්බන්ධ කර ඉහත දක්වූ පනස්හත් වැදෑරුම් කරුණු සමඟ සම්බන්ධ කර විග්‍රහ කරන බව පෙන්වීමට ''සංසන්දනය'' යන පදය යොදා ඇති බව ද පෙනේ.

2. ''උපමා සැසැඳීම'' යන අර්ථයෙහි යෙදෙන මෙහි මුලදිම රූපාදී සත්පනස් අංග යොදා විග්‍රහයක් සිදු කෙරේ. ඕපම්ම සංසන්දනය සුද්ධික සංසන්දනයෙන් විශේෂ වන්නේ, මුල දී ම පනස්හත් වැදෑරුම් ක්‍රමය අනුව පුද්ගල ප්‍රශ්නය විග්‍රහ කිරීමත් එම අංගවල වෙනස එකිනෙක ගෙන විග්‍රහ කිරීමත් තුළිනි. උදාහරණ ලෙස සුද්ධික සංසන්දනාවේ දී ''පුග්ගලො උපලබ්භති සච්කට්ඨ පරමට්ඨෙන, රූපඤ්ච උපලබ්භති සච්ඡිකට්ඨ පරමට්ඨෙනාති'' යන ප්‍රශ්නය හා ඔප්පම්ම සංසන්දනාවේ දී ''රූපං උපලබ්භති සච්චිකට්ඨ වේදනාච උපලබ්භති සච්චිකට්ඨ පරමට්ඨෙන අඤ්ඤං රූපං අඤ්ඤං වේදනාති'' යන ප්‍රශ්න ද්විත්වය සැසඳීමෙන් පෙනේ.

3. චතුර්විධ නය ක්‍රමවේදයක් උපයෝගී කොට ගෙන පනස්හත් වැදෑරුම් අංග අනුව පුද්ගල ප්‍රශ්නය විග්‍රහ කිරීම චතුක්ක නය සංසන්දනා නම් වේ. එම නය සතර නම්,

1. රූපං පුග්ගලෝති
2. රූපස්මිං පුග්ගලෝති
3. අඤ්ඤානුරූපා පුග්ගලෝති
4. පුග්ගලස්මිං පුග්ගලෝති

මෙම ප්‍රශ්න සතරෙහි දක්නට ලැබෙන අනන්‍ය බව, අනුලෝම තදනන්තර බව, අන්‍ය බව හා ප්‍රතිලෝම තදනන්තර බව යන සංකල්ප මත මෙහි පුද්ගල ප්‍රශ්නය විග්‍රහ කෙරේ.

4. සප්පච්චය - අප්පච්චය, සංඛත - අසංඛත, සස්සත - අසසත, සනිමිත්ත - අනිමිත්ත යනාදී ලෙස පුද්ගලයා හා සම්බන්ධ ලක්ෂණ යුගල සතරක් අනුව පුද්ගල ප්‍රශ්නය විග්‍රහ කිරීම ලක්ඛණ යුක්ති කථා නම් කොටසින් සිදු කෙරේ.

5. වචනවල නිරුක්තිය සෙවීමටත් වඩා වචනවල සීමා පිළිබඳ තාර්කික විග්‍රහයක් ඉදිරිපත් කිරීම වචන සෝධන කොටසින් සිදු කෙරේ.

6. පඤ්ඤත්ති යනු පැනවීම හෙවත් සමාජ සම්මතයෙන් උපන් භාෂාව යි. මේ අනුව වචනාර්ථ උපයෝගී කොට ගෙන ප්‍රශ්න විග්‍රහ කිරීම මගින් පුද්ගල ප්‍රශ්නය සාකච්ඡා කිරීම පඤ්ඤත්ති යෝග නම් වේ.

7. පුද්ගලයාගේ ඉපදීම, මියයාම හා ප්‍රතිසන්ධිය යන කරුණු උපයෝගී කොටගෙන පුද්ගල සංකල්පය විග්‍රහ කිරීම ගති-චුති-ප්‍රතිසන්ධි අනුයෝග කොටසින් සිදු කෙරේ.

8. උපාදාන පඤ්ඤත්ති නම් වෙනත් සංකල්පයක් මත රඳා පවත්නා සංකල්ප හෙවත් භාෂාත්මක පැනවීම් ය. පුද්ගල යන සංකල්පය රූපාදී වෙනත් සංකල්ප මත රඳා පවත්නා බැවින් පුද්ගල සංකල්පයේ ඇති උපාදාන පඤ්ඤත්ති ස්වභාවය උපයෝගී කොට ගෙන පුද්ගල පැවැත්ම විග්‍රහ කිරීම උපාදාන පඤ්ඤත්තානුයෝගය කොටසින් සිදු කෙරේ.

9. පුද්ගලයා විසින් කරනු ලබන කුසල අකුසල ක්‍රියා සහ ඒවායෙහි විපාක ද පදනම් කරගෙන පුද්ගල පැවැත්ම පිළිබඳ ගැටලුව විග්‍රහ කිරීම පුරිසකාරානුයෝග කොටසින් සිදු කෙරේ.

10. ඉද්ධිවිධ, දිබ්බසෝත, පුබ්බේනිවාසානුස්සති, පරිචිත්ත විජානන, අසවක්ඛය යන අභිඥා පදනම් කරගෙන සිදු කරනු ලබන පුද්ගලයා හා පුද්ගල පැවැත්ම පිළිබඳ විග්‍රහයක් අභිඤ්ඤානුයෝග කොටසින් සිදු කෙරේ.

10-14. මව, පියා සහෝදරයා, සහෝදරිය, ක්ෂත්‍රීය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර ගහට්ය පබ්බජිත, දේව, මනුස්ස යන සංකල්ප පදනම් කොට ගෙන පුද්ගල පැවැත්ම පිළිබඳ විග්‍රහ කිරීම ඥාතක, ජාති, පටිපත්ති, උප්පත්ති අනුයෝග කොටසින් සිදු කෙරේ.

15. සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අරහත් යන ධර්මාවබෝධ හා බැඳුණු සංකල්ප පදනම් කරගෙන පුද්ගලයාගේ පැවැත්ම විග්‍රහ කිරීම පටිවේධානුයෝග කොටසින් සිදු වේ.

16. සච්ඡිකට්ඨ නම් සාක්ෂාත් කරන ලද හෙවත් ප්‍රත්‍යක්ෂ කරන ලද යන්න යි. සභාව නම් සංඛත හා අසංඛත යනාදිය යි. මේ අනුව ප්‍රත්‍යක්ෂයට ගෝචර වන සංඛත හා අසංඛත ලක්ෂණ ඇති යථාර්ථයෙහි ස්වභාවය සච්චිකට්ඨ සභාවානුයෝග නම් වේ. මහා සංඝයා හා සම්බන්ධ පුරිස යුගල සතර හෝ අෂ්ට ආර්ය පුද්ගලයන් පුද්ගලයා පදනම් කොට ගෙන පුද්ගල පැවැත්ම විග්‍රහ කිරීම සංඝානුයෝග කොටසින් සිදු වේ.

17. සංඛත හා අසංඛත යන සංකල්ප දෙක උපයෝගී කොට ගෙන පුද්ගල පැවැත්ම පිළිබඳ කරන විග්‍රහය සච්චිකට්ඨ සභාවානුයෝග නම් වේ.

පුද්ගල ප්‍රශ්නය විග්‍රහ කිරීමට ඉහත කී කරුණු මෙන් ම පුද්ගල කථාවෙහි අවසානයට දක්වා ඇති නිර්නාමික ව සඳහන් වන තවත් විභජන කිහිපයක් වේ. එනම්,

1. භාවනානුයෝග - භව සංකල්පයට අනිත්‍යාදී ලක්ෂණ ආරෝපණය කරමින් පුද්ගල පැවැත්ම විග්‍රහ කිරීම.

2. වේදනානුයෝගය - සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ යන වේදනා පදනම් කොට ගෙන පුද්ගල පැවැත්ම විග්‍රහ කිරීම.

3. සතිපට්ඨානුයෝගය - කාය, චිත්ත, වේදනා, ධම්ම යන සතර සතිපට්ඨාන පදනම් කොට ගෙන පුද්ගල පැවැත්ම විග්‍රහ කිරීම.

4. බුද්ධදේසනානුයෝගය - සූත්‍ර දේශනා උපයෝගී කොට ගෙන සකවාදී හා පරවාදී දෙදෙනා පුද්ගල පැවැත්ම පිළිබඳව විග්‍රහ කිරීම.

5. සංකල්ප විභංගානුයෝගය - බුද්ධ දේශනාවෙහි ඇතුළත් සංකල්ප පදනම් කොට ගෙන පුද්ගල පැවැත්ම විග්‍රහ කිරීම ආදිය යි.

**පුද්ගල කථා පරිච්ඡේදයේ සකවාදී - පරවාදී වාද ක්‍රමය**

පුද්ගල කථා පරිච්ඡේදයේ සකවාදී පරවාදී විවාදය තුළ තර්ක ඉදිරිපත් වන අයුරු තුන් ආකාරයකින් දැකිය හැකි ය. එනම්,

1. අදාළ සංකල්පය පිළිබඳ විග්‍රහයක් පදනම් කරගෙන තර්ක කිරීම.

2. සූත්‍රාගත කරුණු උපුටා දක්වමින් තර්ක කිරීම.

3. පරිච්ඡේදය අවසන් වන විට සංකල්ප පිළිබඳ දුර්මත දුරු කිරීම සඳහා පද සංකලනය තුළින් තර්ක කිරීම යනාදිය යි.

## I. අදාළ සංකල්පය පිළිබඳ විග්‍රහයක් පදනම් කරගෙන තර්ක කිරීම

සමස්තයක් ලෙස බලනවිට පුද්ගල කථාවේ අතිශයින් ම වැදගත් කොටස වන මෙයට කෙතරම් වැදගත්කමක් ලබා දී ඇත්තේ ද යත්, ඉහත කී පුද්ගල කථා විවාදය සාකච්ඡාවට ගෙන ඇති පරිච්ඡේද දාහත ද (17) නාමික ව සඳහන් නො වන පසු ව කී, පරිච්ඡේද පහෙන් මුල් පරිච්ඡේද තුන ද වෙන් වී ඇත්තේ අදාළ සංකල්පය පිළිබඳ විග්‍රහයක් පදනම් කරගෙන තර්ක කිරීම සඳහා බව පෙනේ.

සුද්ධසච්චකට්ඨයෙහි සකවාදී පක්ෂයෙන් ඇරඹෙන ''*පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨ පරමත්ථේනාති?*'' යන්නෙහි මෙම ප්‍රස්තුතය සමස්ත පුග්ගලකථා පරිච්ඡේදයෙහි ම ප්‍රධාන උපන්‍යාසය යි. පුද්ගලයා පිළිබඳ සංකල්පය සාමාන්‍ය පුද්ගලයෙකු පිළිබඳ ව මෙන් ම ආර්ය ඵලයට පැමිණි පුද්ගලයෙකු පිළිබඳ ව, ඒකාන්තවාදී චින්තනයක් බිහි කිරීමට හේතු විය හැකි ය.[19] බෞද්ධ සම්ප්‍රදාය තුළ ක්‍රමයෙන් මතුවෙමින් පැවති මෙබඳු නැමියාවන් පිළිබඳ සාකච්ඡා කරන ආදිත ම ග්‍රන්ථය වන කථාවත්ථුවේ ඉහත කී ප්‍රකාශය රැගත් පුද්ගල කථා පරිච්ඡේදය ඉතා දීර්ඝ වන්නේ සියුම් දාර්ශනික විශේෂතා සහ තියුණු සංවාදමය තර්ක අතිශය ඉපැරණි භාෂාවකින් වුවත් පහසුවෙන් අවබෝධ කර ගැනීමට තරම් සරල ව නොවේ. අවාසනාවකට මෙන් මෙහි අන්තර්ගත සියුම් දාර්ශනික විශේෂතා සහ තර්කන ක්‍රමවේදය අධ්‍යයනය කිරීමට තරම් මැතක් වනතුරු ම විද්වතුන් උනන්දු වූ බවක් නො පෙනෙන බව මහාචාර්ය ඩී. ජේ. කලුපහනගේ අදහස යි. එනම්, මෙම අගනා දාර්ශනික කෘතිය බොහෝ කලක් යනතුරු නො සැලකිල්ලට ලක් වෙමින් පැවතිණ. ස්විසාන් ඕං (Shewezan Aung) සහ ඩී. ඒ. එෆ් රීස් ඩේවිස් විසින් කරන ලද මුල් ම ඉංග්‍රීසි පරිවර්තනය The Points of Conterversy යන නමින් පාලි ග්‍රන්ථ සමාගම (Pali Text Society) මගින් 1915 දී පළ කරනු ලැබීය. එහෙත් එහි අන්තර්ගතය පිළිබඳ විස්තරාත්මක සාකච්ඡාවක් එස්. එන්. දුබේ විසින් Cross currents in Early Buddhism නම් කෘතිය 1980 දී පළකරන තෙක් සිදු කෙරුණේ නැත. එය ද අන්තර්ගතය පිළිබඳ දාර්ශනික අර්ථකථනයකට වඩා ඒ පිළිබඳ ඓතිහාසික විග්‍රහයකි. එමෙන් ම මෙහි එන ඇතැම් දාර්ශනික සංවාදවල අර්ථය මෙන් ම වචන ද මුල් බුදුදහම අනුව යමින් වටහා ගත යුතු ය. ඥානාතිලෝක හිමි බටහිර උගතුන් අතර අභිධර්මය පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් ඉදිරිපත් කළ පළමු කිහිප දෙනා අතරට අයත් වුව ද උන්වහන්සේ ''Guide through the Abhidhamma Pitaka'' නම් කෘතියේ දී පෙළ සඳහා අරුත්, සපයා ඇත්තේ අටුවාචාරී බුද්ධඝෝෂ හිමි අනුව යමිනි. මෙහි ඇති ගැටලුව නම් බුද්ධඝෝෂ හිමි පෙළ සඳහා අර්ථකථා රචනා කරන විට දැන හෝ නො දැන අනුගමනය කොට ඇත්තේ මුල් බුදුසමය සමඟ පරස්පර විරෝධී සමස්තය හා කොටස් පිළිබඳ

විග්‍රහය යි.[20] බුදුරදුන් විසින් සමස්තය හුදු සම්මතයක් (සම්මුති) ලෙස බැහැර කරන ලද බවත්, කොටස් පමණක් තථ්‍ය ලෙස ගන්නා ලද බවත් යන මතය බුද්ධඝෝෂ හිමි දැරුව ද බුදුරදුන් කිසි ම විටෙක සමස්තයෙහි කොටස් විස්තර කිරීම සඳහා ''පරම'' යන වචනය භාවිත කර නැති බව[21] මහාචාර්ය ඩී. ජේ. කලුපහන පෙන්වා දෙයි.

*''මෙම මතය මිනිස් පුද්ගලකත්වය පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් උපයෝගී කර ගත් මධ්‍ය කාලීන අධිභෞතිකවාදී හුදු, බොහෝ නූතන විචාරකයෝ ද, පුද්ගලත්වය යනු අතථ්‍ය වූ සම්මතයක් හෝ නමක් හෝ පමණක් යැයි ද, ස්කන්ධ පමණක් අවසන් වශයෙන් තථ්‍ය යැයි ද යන ඉක්මන් තීරණයට බටහ. ඇත්ත වශයෙන් ''සච්චිකට්ඨ'' (නිරවශේෂයෙන් සත්‍ය) හා ''පරමට්ඨ'' (අවසාන වශයෙන් තථ්‍ය) යන වචන දෙකට අටුවාව සපයන බුද්ධඝොෂ හිමියෝ එහිලා ස්වභාව සංකල්පය තුළින් එක්තරා ආකාරයක සාරවාදී අර්ථකථනයක් ඉදිරිපත් කරති. මෙහිලා උපයෝගී කොට ගෙන ඇත්තේ ආදී බෞද්ධ සම්ප්‍රදායයෙහි එන පුද්ගලිකත්වය හෙවත් විෂය පිළිබඳ පැහැදිලි කිරීම හා නො ගැළපෙන නාමික හා තථ්‍ය යන භේදය බවට සැකයක් නැත.''*[22]

**සුත්තනිපාතයේ** අට්ඨක වග්ගයෙහි හා බොහෝ සූත්‍රවල සච්ච හා ථේත යන පද විග්‍රහ කොට තිබේ. එමෙන් ම **සුත්තනිපාතයේ** දී සච්ච (සත්‍යය) ථේත (යථාර්ථය) යන සංකල්ප දෙක සාරිපුත්ත මහරහතන් වහන්සේ විසින් යමක භික්ෂුවගේ පුද්ගලයා පිළිබඳ සංකල්පය ප්‍රතික්ෂේප කිරීමට භාවිත කොට ඇත. **සුත්තනිපාතයේ** දී අට්ඨක වග්ගයෙහි සූත්‍ර රාශියකට පාරමාර්ථික වශයෙන් සංකල්පයක් හෝ අදහසක් පිළිගැනීම ප්‍රතික්ෂේප කළ බුදුන්වහන්සේ එබඳු අර්ථයක් හැඳින්වීම සඳහා දන්තජ අත්ථ වෙනුවට තාලුජ අට්ඨ යන පදය යෙදූහ. එය පාරභෞතික අර්ථයක් නිර්දේශ කරන්නේ යැයි පිළිගත හැකි ය.[23] පරම ඵලයක් (පරම+අට්ඨ) වූ නිවන හැඳින්වීමට බුදුන්වහන්සේ දන්තජ පදය යොදා ගැනීමට මැලි නොවූහ. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණක් නම් අට්ඨ යන්න පාරභෞතික යථාර්ථයක් හඳුන්වන අර්ථ නිර්දේශ කරන බව යි. මේ නිසා කථාවත්ථුවෙහි මොග්ගලීපුත්ත තිස්ස හිමියන් යොදා ගන්නා සච්චිකට්ඨ (සත්‍යක-අර්ථ) හා පරමට්ඨක (පරම-අර්ථ) පදයන් පාරභෞතික අදහස් පිළිබිඹු කරන බව පිළිගැනීමට හැකි ය.[24] මේ අනුව යමින් *''පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨ පරමට්ඨනාති''* යන්න විග්‍රහ කළ යුතු බව පෙනේ.[25] තවදුරටත් පුද්ගල කථාවෙහි අන්තර්ගත වාද ක්‍රමය හැදෑරීමට ආරම්භක තර්කය දෙස බැලීම වැදගත් ය.

තිස්ස හිමි :- ඒකාන්ත සත්‍යයක් ලෙස හා අවසාන තථ්‍ය (ධර්ම) යක් ලෙස පුද්ගලයා ලැබේද (*පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨ පරමට්යෙනාති*)

පුද්ගලවාදියා :- එසේය.... (*ආමන්තා*)

තිස්ස හිමි :- ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලැබෙන ආකාරයෙන් ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම) යක් ලෙස පුද්ගලයා ලැබේද? (*යො සච්චිකට්ඨො පරමට්ඨො තතො සො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨ පරමට්යෙනාති?*)

සකවාදියා :- එසේ කිව යුතු නොවේ. (*නහෙවං වත්තබ්බෙ*)

තිස්ස හිමි :- ඔබ බණ්ඩනය වූ බව පිළිගන්න. (*ආජානාහි නිග්ගහං*)

පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් ලෙස හා අවසාන තථ්‍යයක් ලෙස ලැබෙන බව ඔබ කියන්නෙහි නම්, ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම) යක් ලෙස පුද්ගලයා ලැබෙන බව ද ඔබ විසින් කිව යුතු ය. එහෙත් ඔබගේ ප්‍රකාශය - පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය ධර්ම(යක්) ලෙස ලැබෙන බව කිව යුතු ය. එහෙත් ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්මය)යක් ලෙස ලැබෙන බව නො කිය යුතු ය - යන්න වැරදි සහිත ය. ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලැබෙන ආකාරයෙන් ඒකාන්ත සත්‍යයක් ලෙස හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස පුද්ගලයා ලැබෙන්නේ යැයි නො කිව යුතු නම් පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස නොලැබන්නේ යැයි කිව යුතු ය. ඔබගේ ප්‍රකාශය පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් අවසාන තථ්‍ය (ධර්ම)යක් ලැබෙන ආකාරයෙන් ලැබෙන්නේ යැයි කිව යුතු ය. එහෙත් ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලැබෙන ආකාරයෙන් පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස ලැබෙන්නේ යැයි නො කිව යුතු ය - යන්න වැරදි සහිත ය. මෙහි සඳහන් සංකීර්ණ ප්‍රස්තුත දෙකකි. එනම්,

1. ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස පුද්ගලයා ලැබේ. (*උපලබ්භති සච්චිකට්ඨ පරමට්ඨෙන*)

2. ඒකාන්ත සත්‍යයක් හෙවත් අවසාන තථ්‍ය (ධර්ම)යක් ලැබේ. (*උපලබ්භති සච්චිකට්ඨො පරමට්ඨො*) යනාදිය යි.

මෙම ප්‍රස්තුත දෙක අර්ථකථනය කරන නූතන උගතුන් දෙපිරිසකි. එනම්,

1. ග්‍රේයර්, බොකොන්ස්කි. ඤාණතිලෝක හිමි, ජයතිලක හා ඉතා ම මෑතක දී ජයවික්‍රම මහතා යනාදි නූතන උගත්හු බුද්ධඝෝෂ හිමියන් අනුව යමින් පළමු ප්‍රකාශයෙන් පුද්ගලයෙකු විස්තර වන බවත්, දෙවන ප්‍රකාශයෙන් පුද්ගලයා අවසාන වශයෙන් බෙදා දැක්විය හැකි ස්කන්ධ හා සඳහන් කරන බවත් ගෙන හැර දක්වති.[26] මේ අනුව මහාචාර්ය ජයතිලක විසින් පළමු වැනි ප්‍රකාශය P ලෙසත් දෙවනි ප්‍රකාශය Q ලෙසත් සංකේතවත් කරන ලද අතර ඉන් අනතුරු ව ඔහු අවසානයෙහි දක්වන ලද බණ්ඩනය පදනම් කරගෙන තර්ක ක්‍රමයක් ද සකස් කළේ ය.

2. මොග්ගලීපුත්ත තිස්ස හිමියන්ගේ මනසෙහි ඉහත කී උගතුන් කී අදහසට හාත්පසින් ම වෙනස් වූවක් පිළිබිඹු කළ බව පෙන්වා දෙන ඩී.ජේ. කලුපහන තිස්ස හිමිගේ ප්‍රකාශය සංකේතවත් කළ යුත්තේ P හා Q ලෙස නොවන බව දක්වන්නේ සහේතුක ව ය. එනම්,

**PTR - පුද්ගලයා (Person) සත්‍යය (Truth) හා යථාර්ථය ලෙසත් සත්‍ය හා යථාර්ථය (Reality) ලෙසත්**

**TR - සත්‍යය (Truth) හා යථාර්ථය (Reality) ලෙස යි.**[27]

මීට හේතුව නම් තිස්ස හිමියන්ගේ අදහස වූයේ පුද්ගලයා යන වචනය පිළිබඳ නොව සත්‍ය අර්ථය හා පරම අර්ථය පිළිබඳ පරීක්ෂණයක් හෙළිදරව්වක් කිරීම යි. පළමු ප්‍රශ්නයට ප්‍රතිජානාත්මක වුව ද පුද්ගලවාදියා දෙවන ප්‍රශ්නයට ''එසේ කිව යුතු නොවේ'' (*නහෙවං වත්තබ්බෙ*) යනුවෙන් ප්‍රකාශ කරන්නේ තමන් එලෙස ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් පිළිබඳ සංකල්පය නො කියන බව විශද කරමිනි. මෙයින් පැහැදිලි වන්නේ තිස්ස හිමි නගන ප්‍රශ්නයත් පුද්ගලවාදියාගේ පිළිතුරත් එක සේ අර්ථවත් වන බව යි. මෙම සංවාදය තවදුරටත් ඉදිරියට ගෙන යන කලුපහන පෙන්වා දෙන්නේ මොග්ගලීපුත්ත තිස්ස හිමියන් තර්කයෙහි ගම්‍යමාන අර්ථ හෙළි කරනවා පමණක් නොව අවාච්‍යත්වය පිළිබඳ පුද්ගලවාදියාගේ මතය ද පැහැදිලි වන බව යි.[28] ''බුදුන් වහන්සේ අව්‍යාකෘත යැයි සලකා විවරණයක් කිරීමට මැළිවූ ප්‍රශ්නයකට පුද්ගලවාදියා අනුභූතිය පදනම් කොට ගන්නේ විවරණයක් කිරීමට මෙහි දී ඉදිරිපත් වේ.[29] යන්න කලුපහන අදහස යි.

තිස්ස හිමිගේ නිග්‍රහය පිළිනොගන්නා පුද්ගලවාදියා (*න හෙවං නිග්ගහේතබ්බේ*) තිස්ස හිමියන්ගෙන් ප්‍රශ්න නගන්නේ මෙලෙසිනි.

පුද්ගලවාදියා :- ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය(ධර්ම)යක් ලෙස පුද්ගලයෙකු නො ලැබේ ද?

තිස්ස හිමි :- එසේ ය.

පුද්ගලවාදියා :- ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලැබෙනාකාරයෙන් පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය(ධර්ම)යක් ලෙස නො ලැබේ ද?

තිස්ස හිමි :- එසේ කිව යුතු නොවේ.

පුද්ගලවාදියා :- ඔබ ඛණ්ඩනය වූ බව පිළිගන්න. ඒකාන්ත සත්‍යක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස පුද්ගලයා නොලැබේ නම් ඒකාන්ත සත්‍යයක් සහ අවසාන තථ්‍ය (ධර්ම)යක් ලැබෙන ආකාරයෙන් පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම) යක් ලැබෙන ආකාරයෙන් පුද්ගලයා නො ලැබෙන බව කිව යුතු ය, යනුවෙන් ද ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය(ධර්ම)යක් ලැබෙන ආකාරයෙන් පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස නොලැබෙන්නේ යැයි නො කිව යුතු ය, යනුවෙන් ද ඔබ කරන ප්‍රකාශය වැරදි සහගත ය.

ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලැබෙන ආකාරයෙන් පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය(ධර්ම)යක් ලෙස නො ලැබෙන්නේ යැයි නො කිය යුතු නම් පුද්ගලයා අවසාන සත්‍යයක් හා ඒකාන්ත තථ්‍ය (ධර්ම)යක් ලෙස නො ලැබෙන්නේ යැයි නො කිව යුතු ය.

පුද්ගලයා ඒකාන්ත සත්‍යයක් හා අවසාන තත්‍ය (ධර්ම)ක් ලෙස නොලැබන්නේ ද යැයි කිව යුතු ය. එහෙත් ඒකාන්ත සත්‍යක් හා අවසාන තථ්‍ය(ධර්ම) යක් ලැබෙන ආකාරයෙන් පුද්ගලයා ඒකාන්ත සත්‍යක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස නො ලැබෙන්නේ යැයි නො කිය යුතු ය. යනුවෙන් කෙරෙන ඔබගේ ප්‍රකාශය වැරදි සහගත ය.

ඉහත කී සකවාදී පරවාදී තර්ක ද්විත්වයේ අන්තර්ගතකයෙන් ස්ඵුට වන්නේ ථෙරවාදියා ප්‍රකාශ කළ නො හැකි දෙය නො තිබෙන බවත්, ප්‍රත්‍යක්ෂ කළ නොහැකි බවත් අදහස් කරන විට පරවාදියා ඊට ප්‍රතිවිරුද්ධ ව යමින් බුදුරදුන් විසින් පැහැදිලි නො කොට හරින ලද (*අව්‍යාකෘත - නවත්තබ්බෙ*) ප්‍රකාශවලට ආනුභවික විවරණයක් සැපයීමට යි.

එමෙන් ම මෙතෙක් සලකා බැලූ සංවාදවල අනුලෝම ප්‍රතිලෝම යන අවස්ථා ඉතා දීර්ඝ විස්තරයකින් යුක්ත ය. එය බැලු බැල්මට ම පුනරුක්ත සහිත කියමන් ලෙස පෙනී ගිය තර්කයෙහි සංස්ථිතික බවටත් අර්ථවත් බවටත් ඒ සෑම ප්‍රකාශනයක් ම අදාළ වේ.[30] මුල් අවස්ථාවේ දී ථෙරවාදියාත් දෙවැනි අවස්ථාව පුද්ගලවාදියාත් ඉතා දීර්ඝ වූ විස්තරයක් ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂා කරන්නේ අදාළ තර්කයෙහි ගැබ් ව පවත්නා විසංවාදයන් පෙන්වාදීමට යි. නැතිනම් නො ගැළපෙන තැන් විරුද්ධාභාස තම ප්‍රතිවාදියාගේ තර්කයේ දුර්වල තැන් ගවේෂණය කිරීම යි. එහි දී පළමු ව පුද්ගලවාදියා විසින් කළ ප්‍රකාශනයෙහි ඇති විසංවාදී තැන් ථෙරවාදියා විසින් පෙන්වා දෙනු ලැබේ. දෙවනු ව ථෙරවාදීයාගේ ප්‍රකාශය තුළ ඇති විසංවාදී තැන් පුද්ගලවාදියා විසින් පෙන්වා දෙනු ලැබේ. එසේ විසංවාදය පෙන්වා දීමෙන් සංවාදය නැතහොත් තර්කය නිමාවට පත් වේ. නිගමනයක් ඉදිරිපත් නොවේ. මෙය වනාහී ප්‍රාසාංගික තාර්කික ක්‍රමයෙහි ලක්ෂණයක් වේ. විසංවාද පෙන්වා දෙමින් තර්කයෙහි නිගමනය ගම්‍ය කරන මෙම ක්‍රමවේදය මුල් බුදුසමය සමඟ සමානුරූපී වන බව බුදුරදුන්ගේ සූත්‍ර දේශනාවලින් ද පෙනේ. වරෙක බුදුරදුන් සච්චකට දේශනා කරන්නේ ''ඔබගේ මුල් අදහස පසු ව කියන ලද අදහස සමඟ නො ගැළපෙයි. එසේ ම පසු ව කියන ලද අදහස මුලින් කියන ලද ප්‍රකාශය සමඟ නො ගැළපේ,'' (*න ඛො තෙ සන්ධියති පුරිමේනවා පච්ඡිමං පච්ඡිමේන වා පුරිමං*)[31] යනුවෙනි. බුදුරදුන් අනුගමනය කරන ලද ක්‍රමවේදය මොග්ගලීපුත්ත තිස්ස හිමි අනුගමනය කරන්නේ පශ්චාත් කාලීන **''මූලමධ්‍යමකකාරිකාව''** වැනි කෘතිවලට ද ආලෝකය ලබා දෙමිනි.

පරවාදියාගේ ප්‍රකාශවල දෝෂ විමසන තිස්ස හිමි සාරවාදී, අහේතු අප්‍රත්‍යවාදී පුද්ගල සංකල්පයක් වෙත ප්‍රතිවාදියා ගමන් කරන්නේද? යන්න ගවේෂණය කරයි. මේ අනුව ඒකාන්ත සත්‍යයක් ලෙස හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස පුද්ගලයා ලැබේද? යන සංවාදය *සබ්බත්ථ* (සියලු ශරීරයෙහි)[32] *සබ්බදා*

(සැම කාලයක ම)[33] *සබ්බෙසු* (සියලු තැන්හි)[34] යනාදි වශයෙන් සකවාදි හා පරවාදි තර්ක පුළුල් වනු පෙනේ. මෙලෙස විවාදය යන අතරතුර දී පඤ්චස්කන්ධ, ද්වාදසායතන අට්ඨාරසධාතු, බාවිසිතීන්ද්‍රිය ආදි විභජන ක්‍රම තුළින් ද තර්ක ඉදිරිපත් වනු පෙනේ. මේ සඳහා නිදසුනක් පහත පරිදි ය.

තිස්ස හිමි :- ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම) යක් ලෙස පුද්ගලයෙකු ලැබේ ද? ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස රූපයක් ලැබේ ද?

පුද්ගලවාදියා :- එසේයැ....

තිස්ස හිමි :- රූපය අනෙකක් ද.... පුද්ගල අනෙකක් ද....?

පුද්ගලවාදියා :- එසේ නො කිය යුතු ය.

තිස්ස හිමි :- නිග්‍රහය පිළිගනුව.[35]

තවදුරටත් සකවාදී හා පරවාදී තර්ක ඉදිරිපත් කිරීම අධ්‍යයනය කරන විට මෙලොවින් පරලොවටත් පරලොවින් මෙලොවටත් සංසරණය කරන පුද්ගලයෙකු පිළිබඳ වාදය වැදගත් වේ. පුද්ගලයා මෙලොවින් පරලොවටත්, පරලොවින් මෙලොවටත් සංසරණය කරන බව පිළිගන්නා පරවාදියා අන්තවාදී දෘෂ්ටියකින් තර්ක කරන්නේ ද යන්න සඳහා සොයා බැලීමට ථේරවාදියා මෙසේ ප්‍රශ්න කරයි.

තිස්ස හිමි :- පුද්ගලයා මෙලොවින් පරලොවට ද පරලොවින් මෙලොවට ද සංධාවනය කෙරේ ද? (*පුග්ගලො සන්ධාවති අස්මා ලොකො පරං ලොකං පරස්මා ලොකො ඉමං ලෝකන්ති*)

පුද්ගලවාදියා :- එසේ ය....

තිස්ස හිමි :- මෙලොවින් පරලොවට ද පරලොවින් මෙලොවට ද ඒ පුද්ගල (සො පුග්ගලො) සංධාවනය කෙරේ ද? (ශාස්වතවාදී දෘෂ්ටිය අන්‍ය පුද්ගලයෙකු (*අඤ්ඤො පුග්ගලො*) සන්ධාවන කෙරේ ද (උච්ඡේදවාදී දෘෂ්ටිය) ඒ පුද්ගල හා අන්‍ය පුද්ගල නොවන යමෙක් (*නෙව සො සන්ධාවති, න අඤ්ඤො සන්ධාවති*) සන්ධාවන නො කෙරේද? (අහේතු අප්‍රත්‍යවාදි දෘෂ්ටිය)

පුද්ගලවාදියා :- එසේ නො කිය යුතු ය.

සකවාදියා ඉදිරිපත් කරන චතුෂ්කෝටිකයෙන් එකක් හෝ පිළිගත්තේ නම් පරවාදියා හට තර්කාභාසයක් පැනවෙන අතර පරවාදියාගේ තාර්කික ශක්තිය මෙයින් ඉස්මතු වේ.

එමෙන් ම සකවාදියාගේ හා පරවාදියාගේ විවාදයෙහි තරමක් වැදගත් තර්ක කිහිපයක් පුද්ගලකථාවේ ගති අනුයෝග නම් පරිච්ඡේදයේ සඳහන් වේ. පළමු ව ''මිනිසෙකු ව හිඳ දෙවනු ව දෙවියෙකු වන කිසිවෙක් ඇති ද?'' යනුවෙන් ඇසූ විට ප්‍රතිජානාත්මක පිළිතුරක් ලබන සකවාදියා තවදුරටත් පුද්ගලවාදියා අන්තවාදී අදහසක් දරන්නේ ද? යන්න සොයා බැලීමට එම මිනිසා ම දෙවි කෙනෙක් වේද? (*ස්වේව මනුස්සො සො දෙවොති*)[36] යනුවෙන් විමසූ විට එසේ නො කිය යුතු බව ප්‍රතිවාදියා පෙන්වා දෙන්නේ ථෙරවාදී ස්ථාවරය මනාව අධ්‍යයනය කළ අයෙකු බව විශද කරමිනි. එහෙත් මෙම තර්කය තුළින් ම ඉදිරියට යනවිට දාර්ශනික වශයෙන් ප්‍රබල විවාදයක් මතු වනු පෙනේ.

තිස්ස හිමි :- ඒ මිනිසා දෙවියෙක් වේද (*ස්වේව මනුස්සයො සො දෙවොති*)

පුද්ගලවාදියා :- එසේ ය...

ථෙරවාදියා :- මිනිසෙක් ව හිඳ දෙවියෙකු වෙයි.... දෙවියෙකු ව හිඳ මිනිසෙකු වෙයි. මිනිසෙකු වූයේ අනෙකකි. දෙවියෙකු වූයේ අනෙකකි. ''මිනිස් වූ ඒ මේ පුද්ගල සංධාවන කරයි'' යනුවෙන් කීම වැරදි ය.

ථෙරවාදියා :- එබැවින් එම පුද්ගලයා ම මෙලොවින් ච්‍යුත වැ, පරලොව යයි. අනෙකක් නො යයි. යනුවෙන් කීම මරණය නො වෙයි. ප්‍රාණාතිපාත නො ලැබෙයි. කර්මයක් ඇත. කර්ම විපාකයක් ඇත. කළ කර්මයන්ගෙන් විපාකයක් ඇත. පින් පව් පැසෙන කල එම පුද්ගලයාට ම යැයි කීම අසත්‍යකි.[37]

පෙර කී ඡේදයෙහි එම මිනිසා ම දෙවියෙකු වන්නේදැ'යි ඇසූ විට ''එසේ නො කිව යුතු ය'', යනුවෙන් පවසන පුද්ගලවාදියා මෙම තර්කයේ එම මිනිසා ම දෙවියෙක් වේද? යනුවෙන් පිළිතුරු දීම තුළින් ගැටලුවක් මතු වේ. සූත්‍ර පාඨයකින් පුද්ගලවාදියා පිළින කළ බැව් සඳහන් වන බව දක්වන මෙබඳු ම සකවාදියා පසු ව විමසන ඒ මිනිසා ම මහීෂ වේද? ඒ ක්ෂත්‍රිය ම ඒ බ්‍රාහ්මණ වේද? ඒ ශුද්‍රයා ම ඒ වෛශ්‍ය වේද ? යනාදී ප්‍රශ්නවලට ද ''එසේ කිව යුතු නොවේ'' යනුවෙන් දක්වයි. මෙකී කරුණු නිසා ථෙරවාදියාගේ දෝෂදර්ශනයට ලක් වන පුද්ගලවාදියා අර්ථ දෙකකින් පිළිතුරු ලබා දී නැත්නම් සකවාදියා මතු කර දීමට උත්සාහ ගන්නා තර්කාභාසයට හසු ව ඇතැ'යි සිතිය හැකි ය. එහෙත් එබඳු අර්බුදකාරී අවස්ථාවක් සඳහා පසු ව පුද්ගලවාදියා ඉඩ නො තබන බව පැහැදිලි ය.

තිස්ස හිමි :- ඒ පුද්ගලයා ම මෙලොවින් පරලොවට ද පරලොවින් මෙලොවට ද සංධාවන කෙරේද? (*ස්වෙව පුග්ගලො සන්ධාවති අස්මා ලොකා පරං ලොකං පරස්මා ලොකා ඉමං ලොකන්ති*)

පුද්ගලවාදියා :- එසේ ය....

තිස්ස හිමි :- අතක් සිඳුණු පුද්ගලයා අතක් සිඳුණු පුද්ගලයා ම වේද? පා සිඳුණු පුද්ගලයා පා සිඳුණු පුද්ගලයා ම වේද? අත් පා සිඳුණු පුද්ගලයා අත් පා සිඳුණු පුද්ගලයා ම වේද ? කන් සිඳුණු පුද්ගලයා, නහය සිඳුණු පුද්ගලයා, කන් නහය සිඳුණු පුද්ගලයා, ඇඟිලි සිඳුණු පුද්ගලයා, නහර සිඳුණු පුද්ගලයා, කොර වූ අත් ඇති පුද්ගලයා, අත් නැති පුද්ගලයා, කුෂ්ඨ ඇති, ගඩු ඇති, ඇදුම ඇති, අපස්මාරය ඇති පුද්ගල එලෙසින් ම වේද? එමෙන් ම ඔටු, ගොං, කොටලු, ඌරු, මහී ආදීන් ඔවුන් ම වේද?

පුද්ගලවාදියා :- එසේ නො කිව යුතු ය.[38]

තමන් දරන මතය පැහැදිලි කරනු වස් පුද්ගලවාදියා ථෙරවාදීන්ගෙන් විමසන්නේ ''සෝවාන් පුද්ගලයා මිනිස් ලොවින් චුත වී දෙව්ලොවට පැමිණ එහි ද සෝවාන් ව සිටින්නේ ද?'' යන්න යි. එය පිළිගන්නා ථෙරවාදියා විමසන්නේ සෝවාන් පුද්ගලයා මිනිස් ලොවින් චුත වී දෙව්ලොව මනුෂ්‍යයෙකු ලෙස සිටින්නේ ද? යන්න යි. එයට පුද්ගලවාදියා දක්වන්නේ එසේ නො කිව යුතු බව යි. අනතුරු ව අනන්‍ය ය, අවිගත වූ පඤ්චස්කන්ධ සහිත වූ පුද්ගලයාගේ සන්ධාවනය ප්‍රතික්ෂේප කරන පුද්ගලවාදියා ''ගති අභියෝග'' කොටස් අවසානයේ දී ස්වකීය විවාදය පුරාවට ම තමන් දරනා අදහස ප්‍රථම හා අවසන් වරට ගෙනහැර දක්වයි. එනම්, මෙහි අර්ථය නම් ''ස්කන්ධයන් බිඳී යන ආකාරයට නුඹ පවසන 'පුද්ගල' යන්න ද බිඳී යන්නේ නම් බුදුරදුන් විසින් බැහැර කරන ලද උච්ඡේද දෘෂ්ටිය තොපට වේ. ඉදින් ස්කන්ධ බිඳී යන ආකාරයට තොප ගත් 'පුද්ගල' යන්න නො බිඳේ නම් 'පුද්ගල' නො බිඳෙන අර්ථයෙන් නිවන හා සමසම වූයේ ශාස්වත වේ,'' යන්න යි.[39] මෙම විවාදය තුළ රූපය හා පරවාදියා අදහස් කරන ''පුද්ගල'' යන්න සමානාර්ථයෙහි ලා සලකන ථෙරවාදියා සාධාරණ ද යන ගැටලුව මතු වේ.

## II. සූත්‍රාගත කරුණු ඉදිරිපත් කරමින් තර්ක කිරීම

පුද්ගල කථාවේ අතිශය වැදගත් කොටස වන මෙය ඉහත පරිච්ඡේදයේ දක්වා තිබෙන ආකාරයට මෙහි පරිච්ඡේද දාහතට (17) අමතර ව නම් නොකළ එහෙත් අප විසින් බුද්ධ දේශනානුයෝගය නමින් නම් කරන ලද කොටස පිළිබඳ ව මෙහි දී සාකච්ඡා කෙරේ. ථෙරවාදියා මෙන් ම පුද්ගලවාදියා ද බුදුරදුන් දේශනා කළ සූත්‍ර දේශනා එක සේ පිළිගනියි. එමෙන් ම පුද්ගලවාදියා වඩා වැඩි අවධානයක් ලබා දෙන්නේ, තම තර්කය සඳහා බෞද්ධ දේශනාවෙහි ඇති උධෘත කෙරෙහි වන අතර ථෙරවාදියා ගෙනහැර දක්වන්නේ පුද්ගලවාදියාගේ තර්කය නිශේධනය වන මුල් බුදුදහමේ අනාත්මතාව ප්‍රකට කෙරෙන සූත්‍ර දේශනාවල උධෘතයන් ය. එහෙත් පුද්ගල කථාවේ බුද්ධ දේශනානුයෝගය එක් තැනකට සීමා වී නැති බව පෙනේ. මේ අනුව ත්‍රිපිටක බුද්ධ ජයන්ති ග්‍රන්ථ නාමාවලියේ **කථාවත්ථුප්පකරණයේ** පුද්ගලකථා පරිච්ඡේදයේ පිටු අංක හැත්තෑ එකේ (71) සිට ඉදිරියට වරින් වර බුද්ධදේශනානුයෝගය විද්‍යමාන වේ. කෙසේ නමුත් මෙහි පරවාදියා ගෙනහැර දක්වන බුද්ධ දේශනා අතර,

I. තම හිතසුව පිණිස පිළිපන් පුද්ගලයෙක් සිටි (*අත්ථි පුග්ගලො අත්ත හිතාය පටිපන්නොව*)[40]

II. මහණෙනි මම විශුද්ධ වූ මිනිසැස ඉක් ම සිටි දිවැසින් චුත වන, උපදනා, හීන, ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ සුගතිප්‍රාප්ත, දුගතිප්‍රාප්ත, සත්ත්වයන් දක්මි, දන්මි. (*පස්සාමහං භික්ඛවේ දිබ්බේන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන සත්තෙනු චවමානෙ උප්පජ්ජමානෙ, හීනෙ, පණීතෙ, සුවණ්ණෙ, දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි*)[41]

III. මොඝරාජය, හැමදා ස්මෘතිමත් වැ ස්කන්ධලෝකය සත්ත්ව ශුන්‍යතා විසින් බල. මෙසේ සත්කාය දෘෂ්ටිය බිඳ මාර තරණය වෙයි. මෙසේ ස්කන්ධ ලෝකය දක්නාහු මෘත්‍යුරාජ නො දන්නේ යැ. (*සුඤ්ඤතො ලෝකං අවෙක්ඛස්සු මෝඝරාජ සදා සතො. අත්තානු දිට්ඨිං ඌහච්ච ඒවං මච්චුතරොසියා. ඒවං ලෝකං අවෙක්ඛන්තං මුච්චුරාජා න පස්සති.*)[42]

IV. මහණෙනි, එක් පුද්ගලයෙක් ලෝකයෙහි උපදින්නේ, බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුව පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ට අර්ථ පිණිස, හිත පිණිස, සුව පිණිස, උපදනෙයැ... (*ඒක පුග්ගලො භික්ඛවේ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති*)[43]

පරවාදියා මෙලෙස ගෙනහැර දක්වා ඇති සියලු ම පාඨයන් තුළින් මතු කිරීමට උත්සාහ දරා ඇත්තේ පවත්නා පුද්ගලයෙකු පිළිබඳ සංකල්පය බුදුරදුන් ද අනුමත කර ඇති ආකාරය යි.

පරවාදියාගේ පුද්ගල මතය ඛණ්ඩනය කිරීම සඳහා සකවාදියා ද බුද්ධ වචනය වරින් වර මතු කරනු පෙනේ. උදාහරණ ලෙස,

1. උපදනුයේ දුකමැ උපදනේයැ. නිරුද්ධ වනුයේ දුකමැ නිරුද්ධ වෙති'යි ගෙන සැක නො කෙරෙයි. විචිකිච්ඡා නොකෙරෙයි. ඒ ආර්ය ශ්‍රාවකයා හට මෙහි ලා පරප්‍රත්‍ය රහිත ඥානය මැ උපදනේයැ. කෘත්‍යයානය මෙතෙකින් සම්‍යග්දෘෂ්ටි වෙයි. (*දුක්ඛමේව උප්පජ්ජ මානං උප්පජ්ජති, දුක්ඛමේව නිරුජ්ඣමානං නිරුජ්ඣන්තීති න කංඛති. න විචිකිච්ඡති, අපරප්පච්චය ඤාණමෙවස්ස එත්ථ හොති. එත්තාවතා ඛො කච්චාන, සම්මාදිට්ඨි හොති*)[44]

2. වජිරා සූත්‍රයේ දැක්වෙන මාරය, කිම සත්ත්වයකුයි ගන්නෙහිය, තෙල කාගෙ දෘෂ්ටිවේද? (*කින්නු සත්තොති පච්චෙසි මාර දිට්ඨිගතන්නු තෙ*)[45]

3. ආනන්ද හිමිගේ ඉල්ලීමකට අනුව දේශනා කරන ලද වහන්ස පඤ්චස්කන්ධ ලෝකය ශූන්‍ය යැයි කියනු ලැබේ. (*සුඤ්ඤො ලොකො සුඤ්ඤො ලෝකෝති භන්තෙ වුච්චති*)[46]

4. මහණෙනි, ආත්මය ඇති වත්මැ මගේ අත්තනිය වන්නේ ද? (*අත්තනිවා භික්ඛවේ සති අත්තනියං*)[47]

5. මේ ශාස්තෘහු තුන් දෙනෙකු ලෝකයෙහි විද්‍යාමාන වැ ඇත. කවර තිදෙනෙකු ද යත්, මෙලොව කිසි ශාස්තෘවරයෙක් මෙලොව මැ ආත්මය සත්‍ය ලෙස ස්ථිර පනවයි. (*පායොමෙ සෙනිය, සත්ථාරො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං....*)[48] යනාදිය යි.

මෙලෙස බුද්ධ වචනය පිළිබඳ ථෙරවාදියා හා පුද්ගලවාදය දරන ස්ථාවරයන්හි පැහැදිලි වෙනසක් ගම්‍ය වේ. බුද්ධ දේශනාව හේතුඵල ක්‍රමයට විහිදී යන අයුරු බුදුන්වහන්සේ දේශනා කළ සූත්‍රවලින් පෙනේ. එබැවින් බුදුරදුන් එකිනෙකට පරස්පර ධර්ම කරුණු අන්තර්ගත කොට දේශනා ඉදිරිපත් කළ බව සිතිය නො හැකි ය. මෙහි ඇති ගැටලුව වන්නේ බුදුරදුන් ඉදිරිපත් කළ දේශනා අර්ථ විග්‍රහ කිරීමේ ගැටලුවකි. මේ අනුව අවසානයේ මෙම විවාදය රඳා පවත්නේ බුදුරදුන් පෙන්වා දුන් ප්‍රධාන ඉගැන්වීමක් මත ය. එනම්, සූත්‍ර පිටකයේ එකම ස්ථානයක පමණක් දකින්නට ලැබෙන බුද්ධ දේශනාව අවබෝධයට ගන්නා ක්‍රම දෙකකි. එම ක්‍රම දෙක නම්,

1. **නෙය්‍යත්ථ දේසනා**
2. **නීතත්ථ දේසනා**[49] යනු එම ක්‍රම දෙක යි.

නෙය්‍යත්ථ (නෙය්‍ය + අත්ථ) නම් අර්ථය පැමිණිය යුතු, අර්ථය ගෙනහැර දැක්විය යුතු අර්ථය සෘජුව ම දේශනා නො කළ (indirect speach) යන්න යි. බුදුරදුන් ඇතැම් තැන්වල දී *''එක පුග්ගලො භික්ඛවෙ පුග්ගලො''* යනාදි ලෙස පුද්ගලයෙක් පිළිබඳ ව දේශනා කළ නමුත් ඒවා නෙය්‍යත්ථ දේශනා අර්ථයෙන් අවබෝධ කරගත යුතු බව **මනෝරථපූරණී අටුවාව** පෙන්වා දෙයි.[50] සත්ත්වයෙක් ජීවයක් නැත. ශූන්‍ය යි. (*නිස්සත්තො නිජ්ජීවො සුඤ්ඤො*) යනුවෙන් බුදුරදුන් අවධාරණය කර ඇත්තේ එබැවිනි.

නීතත්ථ (නීත + අත්ථ) නම් සෘජුව ම දේශනා කළ (direct speach), අර්ථය පමුණුවන ලද, අර්ථය ගෙනහැර දක්වා තිබෙන යන්න යි. සාතිශය මධ්‍යස්ථ ව ඉහත කී සකවාදී, පරවාදී තර්කයන්හි අන්තර්ගතය ගෙන බැලූවිට ප්‍රකට වන ප්‍රධාන කරුණක් නම් පුද්ගලවාදියා පැහැදිලිව ම බුද්ධ දේශනාව නෙය්‍යත්ථ ලෙස ගෙන තිබෙන බව යි. ථෙරවාද සම්ප්‍රදාය තුළ අන්තශ්චර තීර්ථක (ඇතුළත සිටින දුර්මතධාරීන්)[51] ලෙස හඳුන්වනු ලැබූ පුද්ගලවාදී මතය බිඳ හෙළනු සඳහා ථෙරවාදියා දක්වන බෞද්ධ සූත්‍ර සියල්ල ම පාහේ නීතත්ථ දේශනා බව පෙනේ. නෙය්‍යත්ථ හා නිතත්ථ දේශනා පිළිබඳ ව අදහස් දක්වන බුදුරදුන් පෙන්වා දෙන්නේ යමෙක් නෙය්‍යත්ථ දේශනා නීතත්ථ ලෙසත් නීතත්ථ දේශනා නෙය්‍යත්ථ ලෙසත් ගැනීම තුළින් තමන්වහන්සේට දෝෂාරෝපණය කරන බව යි.[52] පරවාදියා පුග්ගලකථාවෙහි ගෙනහැර දක්වන තර්කවලට ඇතැම්විට ථෙරවාදියාගේ සියුම් විවේචනය එල්ල වන්නේ ද බුදුන්වහන්සේගේ නීතත්ථ හා

නෙයාත්ථ දේශනා පිළිබඳ අනවබෝධය නිසා ද විය හැකි ය. මේ අනුව යමින් කථාවත්ථුප්පකරණ අට්ඨකථාව පුද්ගලකථා පරිච්ඡේදය අවසානයේ සම්මුති හා පරමාර්ථ යන ද්විසත්‍ය විභේදය ගෙනහැර දක්වා තිබේ.[53] එනම්, ලෝක ව්‍යවහාර හේතුවෙන් සංකේත ලෙස යොදනු ලබන භාෂාව සත්‍ය වේ. ධර්මයන්ගේ යථා ලක්ෂණය විදහා දක්වන බැවින් පරමාර්ථ සත්‍යය සංඛ්‍යාත වචනය ද සත්‍යය යන්න යි.

## III. සංකල්ප විග්‍රහය පදනම් කොට ගෙන තර්ක කිරීම

ඉහත දී අප විසින් හඳුනා ගන්නා ලද සංකල්ප විභංග හෙවත් සංකල්ප විග්‍රහානුයෝගය තුළ සාකච්ඡා කෙරෙන කරුණු කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරේ. සකවාද-පරවාද තාර්කික ක්‍රමවේදය අතිශයින් ම ප්‍රබල ද, සියුම් ද වේ. මෙහි දී මොග්ගලීපුත්තතිස්ස හිමියන්ගෙන් පුද්ගලවාදියාට ප්‍රධානතම ප්‍රහාරය එල්ල වනුයේ ගිතෙල් කළය (සප්පිකුම්භ)[54] යන සංකල්පය පිළිබඳ විග්‍රහය පදනම් කොට ගෙන ය. බුදුරදුන් ගිතෙල් කළයක් පිළිබඳ ව කථා කොට ඇති බව පුද්ගලවාදියා විසින් පිළිගැනීමෙන් පසු මොග්ගලීපුත්තතිස්ස හිමියෝ ප්‍රධාන කරුණු දෙකක්, එනම්, කළයෙහි කර්තෘ සහ එය සෑදී ඇති ආකාරය යනාදිය පදනම් කොට ගෙන පහත සඳහන් ආකාරයට ප්‍රශ්න නගති. ගිතෙල් කළය නිර්මාණය කරන්නා වූ කිසිවෙක් සිටී ද?[55] යන්න යි. ගිතෙල් කළය ගිතෙල්වලින් කරන ලද්දක් ලෙස හඳුනා ගැනීම වැරදි ය. වඩා පැහැදිලි ව පෙනෙනුයේ ප්‍රශ්නය ගිතෙල් කළයේ කර්තෘ හට අදාළ වන බව යි. පුද්ගලවාදියා හට ඔප්පු කිරීමට අවශ්‍ය ද එය යි. එහෙත් මොගග්ලීපුත්තතිස්ස හිමියන්ගේ ප්‍රශ්නය වඩාත් සියුම් ලෙස යොමු වන්නේ ගිතෙල් කළයෙහි නිර්මාණය සම්බන්ධයෙනි. ඒ අනුව මොග්ගලීපුත්තතිස්ස හිමි අවධානය යොමු කොට ඇත්තේ භාෂා ව්‍යවහාරය හෙවත් යථාර්ථය හා එම ව්‍යවහාරය සම්බන්ධයෙන් පැන නැගෙන ගැටලු සම්බන්ධයෙනි. මේ අනුව භාෂාව භාෂාවේ සාමාන්‍ය අර්ථය, ආත්මවාදී ව ගත්විට මතු වන අර්බුදකාරී තත්ත්වයක් පුද්ගලවාදියාට ඒත්තු ගැන්වීම මෙම සංකල්ප විග්‍රහයේ අරමුණ යි. ඉංග්‍රීසි භාෂාවට අනුව වතුර බෝතලය පිළිබඳ ව වාක්‍ය දෙකක් මෙසේ දැක්විය හැකි ය. එනම්,

- The Bottle of Water (වතුර සහිත බෝතලය)
- The Water bottle (වතුර බෝතලය)

ඉහත කී දෙවන වාක්‍ය පළමු වාක්‍යයෙන් වෙනස් වන්නේ, වතුර ඇති බව හෝ නැති බව ඉන් ප්‍රකට නො වන නමුදු පළමු වැකියෙන් අනිවාර්යෙන් ම බෝතලය තුළ වතුර ඇති බව තහවුරු වී ඇති බැවිනි. සංකල්ප දෙකේ කොතනකින් වුවත්, බෝතලය තැනී ඇත්තේ වතුරවලිනි, යන අදහස ගතහොත් බෝතලය පිළිබඳ අදහස ආත්මවාදයක් වන අතර ම භාෂා ව්‍යවහාරය වැරදි ලෙස වටහා ගැනීමකි. බටහිර දාර්ශනික විට්ගන්ස්ටෙන් පෙන්වා දෙන්නේ භාෂාව ආශ්‍රිත ව ගැටලුව ඇති වන්නේ භාෂාවේ ව්‍යාකරණය වැරදි ලෙස ගැනීමෙන් බව යි. භාෂාවේ ව්‍යාකරණය නම් සාමාන්‍ය ව්‍යවහාරය තුළ සංකල්ප විග්‍රහ කිරීම සඳහා භාෂාව භාවිත කරන ආකාරය යි. මෙහි දී පුද්ගලවාදියා, ථෙරවාදියාගේ විවේචනයට පාත්‍ර වන්නේ ද භාෂා ව්‍යාකරණය නිසි පරිදි ව්‍යවහාරය සඳහා භාවිත නො කිරීම නිසාවෙනි. ''කෙනෙක් සිල්වත් වේ'' - ''සීලමය නොවේ'' *''සීල වා හෝති න සීලමයෝ''* යන ප්‍රකාශය තුළ සීලමය නම් සීලයෙන් කරන ලද යන්න යි. සීලය හා අනන්‍යය වීම යන්න යි. සීලය අත්‍යාවශ්‍ය ම අංගය බවට පත් කර ගැනීම යන්න යි.

ඉහත කී බුදුරදුන්ගේ ප්‍රකාශය තුළින් අනුමත වන්නේ ද ''සීලමය'' නොව සිල්වත් වීම යන්න යි. බුදුරදුන්ගේ මෙම විග්‍රහය සංකල්ප මාත්‍රයෙන් විග්‍රහ කරන්නේ වුව ද පුද්ගලකථාවෙහි දක්නට ලැබෙන මෙම සංකල්ප විග්‍රහය අතිශයින් ම දාර්ශනික ය.

''ගිතෙල් කළය'' පිළිබඳ සංකල්පය තවදුරටත් විග්‍රහ කරන මොග්ගලීපුත්තතිස්ස හිමියෝ ධාරක (කළය, භාජනය, මල්ල, විල) හා ධාරිත (ගිතෙල්, තෙල්, මී පැණි, කිරි, වතුර) හා සම්බන්ධ සංකල්ප සමූහයක් පිළිබඳ ව සඳහන් වන බුද්ධ දේශනාවක් ගෙනහැර දක්වති. එම සංකල්ප නම්,

1. තෙල් කළය (ථේල කුම්භ)
2. මී පැණි කළය (මධු කුම්භ)
3. නො පැසුණු මත් කළය (වානිත කුම්භ)
4. කිරි කළය (ඛීර කුම්භ)
5. වතුර කළය (උදක කුම්භ) } 1

6. වතුර භාජනය (පානීය ථාලක)
7. වතුර මල්ල (පානීය කොසක)
8. වතුර විල (පානීය සරාවක) } 2

9. දිනපතා ආහාරය (නිච්ච භත්ත)
10. උකු කැඳ (ධුව යාගු)[56] } 3

මේ පිළිබඳ අදහස් දක්වන මහාචාර්ය කලුපහන පෙන්වා දෙන්නේ හුදෙක් මෙහි දී සිදුවන්නේ, සංකල්ප අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු කළ හැකි අයුරින් පැහැදිලි කිරීමකි[57] යන්න යි. ඒ අනුව පළමු වන (I) වන අංකය යටතේ යොදන ලද කළය යන වචනය සෑම යෙදුමකට ම පොදු ය. දෙවන (II) වන කොටසෙහි එම වචනය වෙනුවට වෙනත් වචන තුනක් යෙදී ඇත. පළමු කොටසෙහි වතුර ඇතුළු විවිධ දියර වර්ග පිළිබඳ ව සඳහන් කෙරේ. එහෙත් දෙවන කොටසෙහි සඳහන් වන්නේ එක් දියර වර්ගයක් පිළිබඳ ව පමණි. මේ අනුව පැහැදිලි වන්නේ, පළමු කොටසෙහි පොදු වචනය යෙදී ඇත්තේ ධාරකය සඳහා බව යි. එමෙන් ම දෙවැනි කොටසේ දී එසේ යෙදී ඇත්තේ ධාරිතය සඳහා ය. එම කොටස් දෙකෙන් දක්වන ලද යෙදුම් අටෙහි ඒ වර්ග දෙකට පොදු වූ වචන දක්නට ලැබෙන නමුදු ඒවා කෙසේවත් වෙන වෙන ම තවත් එකක් හා මුළුමනින් ම සමාන නොවේ.

ඉහත කී තෙවැනි කොටසින් පෙන්වන්නේ, නිත්‍යත්ව (ධ්‍රැව) වැනි සංකල්පවල දක්නට ලැබෙන සමානත්වය හේතු කොටගෙන ඇතිවන්නාවූ ස්ථාවරත්වය පිළිබඳ විශ්වාසය ඇත්ත වශයෙන් ම පදනම් විරහිත බව යි. මෙහි දී යමෙක් යමක් නිත්‍ය ලෙස ගන්නේ ද එය හුදෙක් ප්‍රලාපයක් බවට විශද වේ. ඒ

අනුව නිත්‍ය ආහාර වෙනුවට දිනපතා ආහාර පිළිබඳවත් සාරවත් කැඳ යන්නෙන් ස්ථාවර ව පවත්නා කැඳක් නොව උකු කැඳක් යන අර්ථයෙන් ද ව්‍යවහාර කළ හැකි ය. පුද්ගලකථා කොටසේ මෙතෙක් විකාශය වූ තර්ක අවසාන කරමින් මොග්ගලීපුත්තිස්ස හිමියන් පුද්ගලවාදියා වෙත අවසාන ප්‍රශ්නය යොමු කරන්නේ, ස්ථාවර වූ, සාරවත් වූ, සදාකාලික වූ, හා අනිත්‍ය නොවූ කැඳක් ලෝකයෙහි තිබේ ද? යනුවෙනි. පුද්ගලවාදියා තමන් විසින් භාවිත කරන සුපුරුදු වදනින් ම එසේ නො කිය යුතු ය, යනුවෙන් දක්වූ විට මොග්ගලීපුත්තතිස්ස හිමියන්ගේ ඊට ප්‍රත්‍යුත්තර සපයන්නේ, ''එසේ නම් පුද්ගලයා පිළිබඳ ව ඒකාන්ත සත්‍යයක් හා අවසාන තථ්‍ය (ධර්ම)යක් ලෙස කථා නො කරන්න'' යනුවෙන් ප්‍රකාශ කරමිනි.

**සමාලෝචනය**

පුද්ගල කථා පරිච්ඡේදයේ සකවාදී පරවාදී විවාදය තුළ තර්ක ඉදිරිපත් වන අයුරු තුන් ආකාරයකින් අවබෝධ කර ගත හැකි ය. එනම්,

4. අදාළ සංකල්පය පිළිබඳ විග්‍රහයක් පදනම් කරගෙන තර්ක කිරීම.

5. සූත්‍රාගත කරුණු උපුටා දක්වමින් තර්ක කිරීම.

6. පරිච්ඡේදය අවසන් වන විට සංකල්ප පිළිබඳ දුර්මත දුරු කිරීම සඳහා පද සංකලනය තුළින් තර්ක කිරීම යනාදිය යි.

ක්‍රි.පූ. 255 දී රචිත කථාවත්ථුප්පකරණය නම් වූ පාලි ආභිධම්මික ග්‍රන්ථයේ එන සංවාද සොක්‍රටික ක්‍රමය ද ඉක්මවා යන වඩාත් සාර්ථක අපෝහක ක්‍රමයක් විශද කරන අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකි ය.[58] එමෙන් ම කථාවත්ථුප්පකරණයෙහි අඩංගු තාර්කික ක්‍රමවේදය පිළිබඳ ව අධ්‍යයනය කරන විට තිස්ස හිමියන් අනුගමනය කරන තාර්කික ක්‍රමවේදය සමකාලීන සමාජයේ හා බෞද්ධ උගතුන් අතර ජනප්‍රිය ව පැවති බවට කිසිඳු සැකයක් නැත. කෙසේනමුත් තිස්ස හිමියන්ගේ තාර්කික ක්‍රමවේදය පිළිබඳ ව අදහස් දක්වන ඩී.ජේ. කලුපහන මහතා පෙන්වා දෙන්නේ මොග්ගලීපුත්තතිස්ස හිමියන්ගේ ප්‍රයත්නය වූයේ කිසිම තර්ක ක්‍රමයක් අනුගමනය නො කර දෙපක්ෂයට ම තම තමන්ගේ භාෂාව යොදා ගැනීමට අවසර තබා එයින් කවරක් බුදුන් වහන්සේගේ දර්ශනය හා ගැළපෙන්නේ ද? යන්න පැහැදිලි කිරීමට යි.[59] ඒ බව ථේරවාදයෙන් මිථ්‍යා දෘෂ්ටි ලෙස බැහැර කෙරුණ ද කථාවත්ථුප්පකරණ විවාදයේ දී ථේරවාදියා හෝ පුද්ගලවාදියා ජයග්‍රහණය හෝ පරාජය භාරගත් බවක් සඳහන් නො කිරීමෙන් ද පැහැදිලි වේ.

කථාවත්ථුවේ මතවාදයන් සියයකට වඩා විග්‍රහ කරන ලද නමුත් ඒවා අතර ඇත්තේ ප්‍රධාන මතවාදයන් තුනක් පමණක් බව පෙන්වා දෙන මහාචාර්ය ඩී.ජේ. කලුපහන මහතා මිථ්‍යා දෘෂ්ටි ලෙස සලකන ලද එම මතවාද පෙළගස්වා ඇත්තේ මෙසේ ය.

1. **පුද්ගලවාදය**
2. **සර්වාස්තිවාදය**
3. **ලෝකෝත්තරවාදය**[60]

කලුපහන මහතා ඉහත පෙළ ගස්වා ඇති මතවාද අතුරින් පුද්ගලවාදය කෙරේ කථාවත්ථුප්පකරණයෙහි සුවිශේෂ අවධානයක් යොමු වන්නේ එය පළමු කොට ම පළමු පරිච්ඡේදයේ දී ම දක්වන නිසා පමණක් ම නොව පරවාදී-සකවාදී විවාදය පුළුල් ලෙස හා සම්පූර්ණ ලෙස කථාවත්ථුප්පකරණයෙහි භාවිත වන තර්ක ක්‍රමවේද සියල්ල අන්තර්ගත වන බැවිනි.

## ආන්තික සටහන්

1. සුත්තනිපාතය, න්‍යාය සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1977, පි. 825, V-2-19-2-23

   ''සුත්තො කථායං පරිසාය මජ්ජක්ඛ''

2. අසෝක සමයේ සාකච්ඡාවට ලක් වී ඇති එම වාද නම්,
   1. මහාසාංඝික (ක්‍රි.පූ. 4)
   2. ගෝකුලික (ක්‍රි.පූ.4)
   3. භද්‍රයානික (ක්‍රි.පූ. 3)
   4. මහීශාසක (ක්‍රි.පූ. 3)
   5. වාත්සීපුත්‍රීය (ක්‍රි.පූ. 4)
   6. සර්වාස්තිවාදී (ක්‍රි.පූ. 4)
   7. සම්මිතීය (ක්‍රි.ව. 4)
   8. වජ්ජිපුත්තක (ක්‍රි.පූ. 4)
3. ප්‍රධාන කර්තෘ, හෙට්ටිආරච්චි, ඩී. ඊ. සිංහල විශ්වකෝෂය, 6 කාණ්ඩය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව, 1978, පි. 141
4. පරි : පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, පාලි සාහිත්‍යයේ ඉතිහාසය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2003, පි. 361
5. එම, පි. 361
6. පරිඃ පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, පාලි සාහිත්‍යයේ ඉතිහාසය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2003, පි. 381
7. කථාවත්ථුප්පකරණය 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණ, එම, පෙරවදන, පි. XXIX
8. පරි : පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. පාලි සාහිත්‍යයේ ඉතිහාසය, එම, පි. 361
9. පරි : තිලකරත්න අසංග, කථාවත්ථුප්පකරණයෙහි අර්ථකථන සම්ප්‍රදාය හා අභිධර්ම දර්ශනය, අභිධර්ම අධ්‍යයනය, සංස්: තිලකරත්න අසංග, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ, කොළඹ 10, 1995, පි. 113
10. ප්‍රධාන කර්තෘ, හෙට්ටිආරච්චි, ඩී.ඊ. සිංහල විශ්වකෝෂය, 6, එම, පි. 141
11. කථාවත්ථුප්පකරණය 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණ, එම, පෙරවදන, පි. XXVII
12. ප්‍රධාන කර්තෘ : හෙට්ටිආරච්චි ඩී.ඊ. සිංහල විශ්වකෝෂය, 6, එම, පි. 142
13. කථාවත්ථුප්පකරණය1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණ, එම, පෙරවදන, පි. XXXI
14. එම, පි. XXXII
15. එම, පි. XXXII

16. එම, පි. XXXII
17. එම, පි. XXXII
18. වීරසිංහ, එස්. ජී. එම්. භාරතීය තර්ක ප්‍රවේශය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, කැලණිය, 1973, පි. 17-18
19. කලුපහන, ඩී.ජේ., 1995, කථාවත්ථුප්පකරණයෙහි අර්ථකථන සම්ප්‍රදාය සහ අභිධර්ම දර්ශනය, පරිඃ තිලකරත්න අසංග, අභිධර්ම අධ්‍යයන, සංස්ඃ තිලකරත්න, අසංග, පි. 113
20. එම, පි. 113
21. එම, පි. 114
22. එම, පි. 114
23. එම, පි. 126
24. එම, පි. 127
25. එහෙත් බුද්ධ ජයන්ති සංස්කරණ කථාවත්ථුප්පකරණයේ පවා පරමට්ඨ වෙනුවට යොදා ඇත්තේ පරමත්ථ යන පදය යි. එනම්, ''පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමත්ථෙනා ති'' යනුවෙනි. කලුපහන මහතා පෙන්වා දෙන ආකාරයට බොහෝ මුද්‍රණවල පරමත්ථ යන වදන මේ සඳහා භාවිත කළ ද සියම් මුද්‍රණයෙහි ඇත්තේ පරමට්ඨ යන පදය යි.
26. එම, කථාවත්ථුප්පකරණයෙහි අර්ථකථන සම්ප්‍රදාය සහ අභිධර්ම දර්ශනය, පරිඃ තිලකරත්න අසංග, අභිධර්ම අධ්‍යයන, පි. 116
27. එම, බෞද්ධ දර්ශන ඉතිහාසය, පි. 128
28. එම,, කථාවත්ථුප්පකරණයෙහි අර්ථකථන සම්ප්‍රදාය සහ අභිධර්ම දර්ශනය, පරි, තිලකරත්න අසංග, අභිධර්ම අධ්‍යයන, පි. 117.
29. එම,, බෞද්ධ දර්ශනයේ ඉතිහාසය, පි. 129
30. ඉලංගකෝන්, සමන්ත., බෞද්ධ ලෝක දෘෂ්ටිය, පි. 76
31. මජ්ඣිමනිකාය 1, මූලපණ්ණසකය, මහායමක වග්ග, චූළසච්චක සූත්‍රය, පි. 550
32. කථාවත්ථුප්පකරණය1, එම, පි. 24
33. එම, පි. 26
34. එම, පි. 28
35. එම, පි. 45
36. එම, පි. 88
37. එම, පි. 91
38. එම, පි. 95
39. එම, පි. 101

*''ඛන්ධෙසු භිජ්ජමානෙසු - සොචෙ භිජ්ජති පුග්ගලෝ*
*උච්ඡේදා භවති දිට්ඨී - යා බුද්ධෙන විවජ්ජිතා''*
*''ඛන්ධෙසු භිජ්ජමානෙසු - නො චෙ භිජ්ජති පුග්ගලො*
*පුග්ගලො සස්සතො හොති - නිබ්බානේන සමසමො ති''*

40. කථාවත්ථුප්පකරණය I, එම, පි. 71

41. එම, පි. 125
42. එම, පි. 176
43. එම, පි. 179
44. එම, පි. 181
45. එම, පි. 181
46. එම, පි. 182
47. එම, පි. 184
48. එම, පි. 184
49. *අංගුත්තරනිකාය* 1, 1960, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, පි. 119 - 124
    *"ද්වෙ මෙ භික්ඛවෙ තථාගතං අබ්භාචික්ඛන්ති කතමෙ ද්වෙ? යොච නෙය්‍යත්ථං සුත්තං නීතත්ථෙ සුත්තන්තොති දීපෙති. යොච නීතත්ථං සුත්තන්තං නෙය්‍යත්ථො සුත්තන්තෝති දීපෙති."*
50. මනෝරථපූරණීඅට්ඨකථා 1, සිංහල පරිවර්තනය, 2003, පි. 418
51. නානායක්කාර, සනත්., 2003, මුල් බුදුදහමේ සිට වජ්‍රයානය තෙක් සරල හැඳින්වීමක්, පි. 55
52. අංගුත්තරනිකාය 1, එම, පි. 119, 124
53. පඤ්චප්පකරණට්ඨකථා 1, එම, පි. 122
    ***"සංකේත වචනං සච්චං - ලොක සම්මුති කාරණං***
    ***පරමත්ථ වචනං සච්චං - ධම්මානං තථලක්ඛණං"***
54. කථාවත්ථුප්පකරණය 1, එම, පි. 187
55. එම, පි. 187
56. එම, පි. 189
57. කලුපහන, ඩී.ජේ., කථාවත්ථුප්පකරණයෙහි අර්ථකථන සම්ප්‍රදාය සහ අභිධර්ම දර්ශනය, පරිඃ තිලකරත්න අසංග, අභිධර්ම අධ්‍යයනය, පි 119
58. ඉලංගකෝන්, සමන්ත., බෞද්ධ ලෝක දෘෂ්ටිය, එම, පි. 71
59. කලුපහන, ඩී.ජේ., බෞද්ධ දර්ශන ඉතිහාසය, එම, පි. 127
60. කලුපහන, ඩී.ජේ., බෞද්ධ චින්තාවේ ඉතිහාසය, තිවිර ප්‍රකාශන, නුගේගොඩ, 2003, පි. 123

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

*අංගුත්තරනිකාය* 1, 1960, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

කථාවත්ථුප්පකරණය 1, 1967.බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, පුනර්මුද්‍රණ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

පඤ්චප්පකරණට්ඨ කථා 1 (සිංහල පරිවර්තනය) 2008, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
මජ්ඣිමනිකාය 1, 1973, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
මනෝරථපූරණීඅට්ඨකථා 1, සිංහල පරිවර්තනය, 2003, ශ්‍රී ලංකා ආසියාතික සමිතිය.
*මිලින්ද ප්‍රශ්න,* 1997, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල .

*මිලින්ද ප්‍රශ්නය* (සිංහල), ප්‍රතිසංස්කෘත, 2000, සරණංකර ස්ථවිර, ගලගම., එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

සුත්තනිපාතය, 2006, ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම, බණ්ඩාරවෙල.

**ද්විතීයික මූලාශ්‍රය**

**ශාස්ත්‍රීය ග්‍රන්ථ**

ආනන්ද හිමි, කොන්ගස්තැන්නේ., 1996, අභිධර්මය වෙනම ම පිටකයක් ද? කතෘ ප්‍රකාශනයකි.
ඉලංගකෝන්, සමන්ත., 2007, බෞද්ධ ලෝක දෘෂ්ටිය, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා-ඇල.
කලුපහන, ඩී.ජේ., 2003, බෞද්ධ දර්ශන ඉතිහාසය, තිවිර ප්‍රකාශන, නුගේගොඩ.
ඛේමානන්ද හිමි, හැගොඩ., 1992, *ථෙරවාද න්‍යාය*, කර්තෘ ප්‍රකාශනයකි.
නානායක්කාර, සනත්., 2003, මුල් බුදුදහමේ සිට වජ්‍රයානය තෙක් සරල හැඳින්වීමක්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
රාජපක්ෂ, දිල්ශාන් මනෝජ්., 2015, කථාවත්ථුප්පකරණයෙහි වාද විවාද (පුද්ගල කථා පරිච්ඡේදය පදනම් කරගත් තාර්කික අධ්‍යයනයක්) දම්සක් ප්‍රකාශනයකි, පිටකෝට්ටේ.

**ශාස්ත්‍රීය ලිපි**

කලුපහන, ඩී.ජේ., 1995, කථාවත්ථුප්පකරණයෙහි අර්ථකථන සම්ප්‍රදාය සහ අභිධර්ම දර්ශනය, පරිඃ තිලකරත්න අසංග, අභිධර්ම අධ්‍යයන, සංස්ඃ තිලකරත්න, අසංග, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ, කොළඹ 10.
රාජපක්ෂ, දිල්ශාන් මනෝජ්., 2016, කථාවත්ථුප්පකරණයේ සකවාදි - පරවාදි තර්කවල සදාචාරාත්මක අගයඃ පුද්ගලකථා පරිච්ඡේදය පදනම් කරගත් අධ්‍යයනයක්, පටිපදා, කථාවත්ථුප්පකරණ අධ්‍යයන අංකය, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායික 70 වැනි උපසම්පදා පුණ්‍යෝත්සව සමරු ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්, ධම්මපාල හිමි, අක්මීමන, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායික 70 වැනි උපසම්පදා පුණ්‍යෝත්සව කමිටුව.
සුධීරානන්ද හිමි, තල්ගමුවේ., 2005, කථාවත්ථුප්පකරණාගත ධර්ම කරුණු පිළිබඳ විමර්ශනයක්, අභිධර්ම සම්භාවනා, සප්තප්‍රකරණ ධර්ම සංග්‍රහය, සංස්ඃ ඥානසාර හිමි, පස්ගම්මන, ඤාණජීව හිමි, ගොඩවෙල, පෙරේරා, ආරියපාල, පට්ඨාන ධර්ම සභාව, කොළඹ 05.

**ශබ්දකෝෂ/විශ්වකෝෂ**

ප්‍රධාන කර්තෘ, හෙට්ටිආරච්චි, ඩී. ඊ., 1978, සිංහල විශ්වකෝෂය, 6 කාණ්ඩය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.